සියලු ම හිමිකම් ඇවිරිණි.


රහස්‍ය ලේඛනයකි.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

## අ.පො.ස. (උ.පෙළ) විභාගය - 2024

# 54 - පෙරදිග සංගීතය

ලකුණු දීමේ පටිපාටි



මෙය උත්තරපත්‍ර පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා සකස් කෙරිණි.
ප්‍රධාන/ සහකාර පරීක්ෂක රැස්වීමේ දී ඉදිරිපත්වන අදහස් අනුව මෙහි වෙනස්කම් කරනු ලැබේ.

අවසන් සංශෝධන ඇතුළත් කළ යුතුව ඇත.

# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස්පෙළ) විභාගය - 2024

## 54 - පෙරදිග සංගීතය

## ප්‍රශ්නපත්‍ර ව්‍යුහය හා ලකුණු බෙදීයාම

I පත්‍රය - 02 x 50 = 100

II පත්‍රය - I කොටස = 02 x 20 = 40

II කොටස = 01 x 20 = 20

III කොටස = 02 x 20 = $\frac{40}{100}$

I පත්‍රය = 100

II පත්‍රය = 100



අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

# උත්තරපත්‍ර ලකුණු කිරීමේ පොදු ශිල්පීය ක්‍රම

උත්තරපත්‍ර ලකුණු කිරීමේ හා ලකුණු ලැයිස්තුවල ලකුණු සටහන් කිරීමේ සම්මත ක්‍රමය අනුගමනය කිරීම අනිවාර්යයෙන් ම කළ යුතුවේ. ඒ සඳහා පහත පරිදි කටයුතු කරන්න.

1. උත්තරපත්‍ර ලකුණු කිරීමට රතුපාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කරන්න.
2. සෑම උත්තරපත්‍රයකම මුල් පිටුවේ සහකාර පරීක්ෂක සංකේත අංකය සටහන් කරන්න.

   ඉලක්කම් ලිවීමේදී **පැහැදිලි ඉලක්කමෙන්** ලියන්න.
3. ඉලක්කම් ලිවීමේදී වැරදුණු අවස්ථාවක් වේ නම් එය පැහැදිලිව තනි ඉරකින් කපා හැර නැවත ලියා කෙටි අත්සන යොදන්න.
4. එක් එක් ප්‍රශ්නයේ අනු කොටස්වල පිළිතුරු සඳහා හිමි ලකුණු ඒ ඒ කොටස අවසානයේ △ ක් තුළ ලියා දක්වන්න. අවසාන ලකුණු ප්‍රශ්න අංකයත් සමග □ ක් තුළ, භාග සංඛ්‍යාවක් ලෙස ඇතුළත් කරන්න. ලකුණු සටහන් කිරීම සඳහා පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා ඇති තීරුව භාවිත කරන්න.

උදාහරණ : ප්‍රශ්න අංක 03

(i) .................................................... √ △ $\frac{4}{5}$

(ii) .................................................... √ △ $\frac{3}{5}$

(iii) .................................................... √ △ $\frac{3}{5}$

(03) (i) $\frac{4}{5}$ + (ii) $\frac{3}{5}$ + (iii) $\frac{3}{5}$ = □ $\frac{10}{15}$

**බහුවරණ උත්තරපත්‍ර : (කවුළු පත්‍රය)**

1. අ.පො.ස. (උ.පෙළ) හා තොරතුරු තාක්ෂණ විභාගය සඳහා කවුළු පත්‍ර දෙපාර්තමේන්තුව මගින් සකසනු ලැබේ. නිවැරදි වරණ කපා ඉවත් කළ සහතික කරන ලද කවුළුපතක් ඔබ වෙත සපයනු ලැබේ. සහතික කළ කවුළු පත්‍රයක් භාවිත කිරීම පරීක්ෂකගේ වගකීම වේ.
2. අනතුරුව උත්තරපත්‍ර හොඳින් පරීක්ෂා කර බලන්න. කිසියම් ප්‍රශ්නයකට එක් පිළිතුරකට වඩා ලකුණු කර ඇත්නම් හෝ එකම පිළිතුරක්වත් ලකුණු කර නැත්නම් හෝ වරණ කැපී යන පරිදි ඉරක් අඳින්න. ඇතැම් විට අයදුම්කරුවන් විසින් මුලින් ලකුණු කර ඇති පිළිතුරක් මකා වෙනත් පිළිතුරක් ලකුණු කර තිබෙන්නට පුළුවන. එසේ මකන ලද අවස්ථාවකදී පැහැදිලිව මකා නොමැති නම් මකන ලද වරණය මත ද ඉරක් අඳින්න.

3. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබන්න. නිවැරදි පිළිතුර ✓ ලකුණකින් ද, වැරදි පිළිතුර 0 ලකුණකින් ද වරණ මත ලකුණු කරන්න. නිවැරදි පිළිතුරු සංඛ්‍යාව ඒ ඒ වරණ තීරයට පහළින් ලියා දක්වන්න. අනතුරුව එම සංඛ්‍යා එකතු කර මුළු නිවැරදි පිළිතුරු සංඛ්‍යාව අදාළ කොටුව තුළ ලියන්න.

**ව්‍යුහගත රචනා හා රචනා උත්තරපත්‍ර :**

1. අයදුම්කරුවන් විසින් උත්තරපත්‍රයේ හිස්ව තබා ඇති පිටු හරහා රේඛාවක් ඇඳ කපා හරින්න. වැරදි හෝ නුසුදුසු පිළිතුරු යටින් ඉරි අඳින්න. ලකුණු දිය හැකි ස්ථානවල හරි ලකුණු යෙදීමෙන් එය පෙන්වන්න.

2. ලකුණු සටහන් කිරීමේදී ඕවර්ලන්ඩ් කඩදාසියේ දකුණු පස තීරය යොදා ගත යුතු වේ.

3. සෑම ප්‍රශ්නයකටම දෙන මුළු ලකුණු උත්තරපත්‍රයේ මුල් පිටුවේ ඇති අදාළ කොටුව තුළ ප්‍රශ්න අංකය ඉදිරියෙන් අංක දෙකකින් ලියා දක්වන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් අනුව ප්‍රශ්න තෝරා ගැනීම කළ යුතුවේ. සියලු ම උත්තර ලකුණු කර ලකුණු මුල් පිටුවේ සටහන් කරන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස්වලට පටහැනිව වැඩි ප්‍රශ්න ගණනකට පිළිතුරු ලියා ඇත්නම් අඩු ලකුණු සහිත පිළිතුරු කපා ඉවත් කරන්න.

4. පරීක්ෂාකාරීව මුළු ලකුණු ගණන එකතු කොට මුල් පිටුවේ නියමිත ස්ථානයේ ලියන්න. උත්තරපත්‍රයේ සෑම උත්තරයකටම දී ඇති ලකුණු ගණන උත්තරපත්‍රයේ පිටු පෙරළමින් නැවත එකතු කරන්න. එම ලකුණ ඔබ විසින් මුල් පිටුවේ එකතුව ලෙස සටහන් කර ඇති මුළු ලකුණට සමාන දැයි නැවත පරීක්ෂා කර බලන්න.

**ලකුණු ලැයිස්තු සකස් කිරීම :**

සියලු ම විෂයන්හි අවසාන ලකුණු ඇගයීම් මණ්ඩලය තුළදී ගණනය කරනු නොලැබේ. එබැවින් එක් එක් පත්‍රයට අදාළ අවසාන ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවලට ඇතුළත් කළ යුතු ය. I පත්‍රය සඳහා බහුවරණ පිළිතුරු පත්‍රයක් පමණක් ඇති විට ලකුණු ලැයිස්තුවට ලකුණු ඇතුළත් කිරීමෙන් පසු අකුරෙන් ලියන්න. අනෙකුත් උත්තරපත්‍ර සඳහා විස්තර ලකුණු ඇතුළත් කරන්න. 51 චිත්‍ර විෂයයේ I, II හා III පත්‍රවලට අදාළ ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවල ඇතුළත් කර අකුරෙන් ද ලිවිය යුතු වේ.

***



අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - 2024
## ප්‍රශ්න පත්‍රයේ ලකුණු බෙදී යාමේ සාරාංශය

### පෙරදිග සංගීතය I පත්‍රය

එක් පිළිතුරකට ලකුණු 02 බැගින් ප්‍රශ්න 50 ට මුළු ලකුණු 100 යි.

### පෙරදිග සංගීතය II පත්‍රය

**I කොටස**

(01) (i) 04
(ii) 06
(iii) 04
(iv) 06 මුළු ලකුණු 20 යි.

(02) (i) 04
(ii) 06
(iii) 05
(iv) 05 මුළු ලකුණු 20 යි.

(03) (i) 03
(ii) 05
(iii) 06
(iv) 06 මුළු ලකුණු 20 යි.

(04) (i) 04
(ii) 08
(iii) 08 මුළු ලකුණු 20 යි.

(05) (i) 06
(ii) 04
(iii) 04
(iv) 06 මුළු ලකුණු 20 යි.

(06) (i) 04
(ii) 04
(iii) 08
(iv) 04 මුළු ලකුණු 20 යි.

(07) (i) 06
(ii) 04
(iii) 06
(iv) 04 මුළු ලකුණු 20 යි.

(08) ලකුණු 05 ×4=20 යි. මුළු ලකුණු 20 යි.

II පත්‍රය - 20 x 5 මුළු ලකුණු 100යි

අ.පො.ස (උ.පෙළ) විභාගය - 2024

පෙරදිග සංගීතය - I

**අභිමතාර්ථ**

01. ශ්ලෝකයෙන් සංගීතය නිර්වචනය කර ඇති මුල්ම කෘතිය තෝරයි.
02. කර්ණාටක මේල හඳුන්වා දුන් සංගීතඥයා තෝරයි.
03. පරමේල ප්‍රවේශක රාගයකට අයත්වන ථාට දෙක තෝරයි.
04. ධිං අක්ෂරය උත්පාදනයට යොදා ගන්නා අවනද්ධාක්ෂර දෙක තෝරයි.
05. බලිස්ථානය දෙවන හා සිවුවන විභාගයන්හි යෙදෙන තාල යුගලය තෝරයි.
06. ඛ්‍යාල් ගායනය සඳහා යොදා ගැනීමට වඩාත් සුදුසු භාණ්ඩ යුගලය තෝරයි.
07. දී ඇති රාගයට පංචමය යොදා ගත් විට එය හඳුන්වන ස්වරයේ නම තෝරයි.
08. විකෘති ස්වර එකක් පමණක් ඇතුළත් රාගය තෝරයි.
09. රිමප, ස්වර සංගතිය නොයෙදෙන රාගය තෝරයි.
10. එකම ස්වරය කෝමළ හා ශුද්ධ වශයෙන් යෙදෙන රාගය තෝරයි.
11. සන්ධි ප්‍රකාශ සමයට අයත් රාගය තෝරයි.
12. කෝමළ ධෛවතය වැඩි වශයෙන් ආන්දෝලනය වන රාගය තෝරයි.
13. අද්ව දර්ශක ස්වරය පදනම් වූ රාග වර්ගය තෝරයි.
14. ස්වර පිහිටීම සමාන වන භාණ්ඩ යුගලය තෝරයි.
15. දී ඇති ප්‍රස්තාරයට අනුව 'මූර්කි' පෙන්නුම් කරන විභාගය තෝරයි.
16. දී ඇති ප්‍රස්තාරයට අනුව 'ඛන්' හා මීන්ඩ් ස්වර ඇතුළත් විභාග තෝරයි.
17. දී ඇති ප්‍රස්තාරයට අනුව වක්‍ර ස්වර ඛණ්ඩය ඇතුළත් විභාග තෝරයි.
18. සිතාර් වාදනයට ප්‍රවීන සංගීතඥයින් තෝරයි.
19. තබ්ලා වාදනයක් සඳහා වැයෙන ස්වර ප්‍රබන්ධය හඳුන්වනු ලබන නම තෝරයි.
20. හින්දුස්ථානී සංගීත වාදන භාණ්ඩ පිළිබඳ නිවැරදි ප්‍රකාශය තෝරයි.
21. නවග්‍රහයින් උදෙසා පවත්වනු ලබන ශාන්තිකර්මය තෝරයි.
22. දී ඇති ගී පාදයේ යෙදෙන සඳැස්මත් හා ගී මත් ගණන තෝරයි.
23. දී ඇති ගී වර්ග තුනට අදාළ නිවැරදි ප්‍රකාශය හඳුනා ගනියි.
24. සේ ගී පමණක් යෙදෙන ගී වර්ග හඳුනා ගනියි.
25. ශ්‍රී ලංකාවේ ප්‍රථම නාඩගම නිර්මාණය කළ සංගීතඥයා තෝරයි.
26. නූර්ති ගීතයට අදාළ නූර්තියේ නම තෝරයි.
27. අපරදිග සංගීත භාණ්ඩ අයත්වන වර්ගීකරණ දෙක තෝරයි.
28. අපරදිග ස්වර ප්‍රස්තාරකරණයේ දී වටිනාකම් අනුව පෙන්නුම් කෙරෙන සංකේත නාම තෝරයි.
29. ස්වර සංකලනය වී නිර්මාණය වූ ස්වර සංඝාතය හැඳින්වෙන නාමය තෝරයි.
30. බහුවිධ බුද්ධිය සංකල්පයට අදාළ නොවන වරණය තෝරයි.
31. දී ඇති කර්ණාටක හා හින්දුස්ථානී ග්‍රන්ථ රචනා කළ ගත් කතුවරුන් නම් කරයි.
32. දී ඇති සිංහල බසින් රචිත ග්‍රන්ථ රචනා කළ කතුවරුන් නම් කරයි.
33. දී ඇති සංගීත භාණ්ඩ වාදනයට ප්‍රවීණ ඉන්දීය සංගීතඥයින් දෙදෙනෙකු නම් කරයි.
34. උත්තර භාරතීය සංගීතයට අයත් අළුවෙන් වැයෙන හා පර්දා රහිත සංගීත භාණ්ඩ නම් කරයි.
35. සිතාර් ගත් වාදන ශෛලියක් නම් කර,තෝඩා සඳහා ආදේශිත යෙදුම නම් කරයි.
36. තාම්පුරාවේ තත් සුසර කෙරෙන ස්වර අනුව නිර්දේශිත රාග නම් කරයි.
37. මිතියෙන් සමාන හා ගතියෙන් අසමාන තාල නම් කරයි.
38. පක්වාජය තාල වාදනය සඳහා යෙදා ගන්නා ගායන ශෛලීන් නම් කරයි.
39. දී ඇති ප්‍රකාශය අනුව තබ්ලාවෙන් වැයූ තාලය නම් කරයි.
40. ශුද්ධ ස්වර රචනාවක ස්වරයක් කෝමළ කළ විට යෙදෙන රාගය හා දී ඇති ස්වර රචනාවේ සමස්ථානය ට ගැළපෙන ස්වරය නම් කරයි.
41. දී ඇති ප්‍රකාශයෙහි සඳහන් වාද්‍ය භාණ්ඩ දෙක අයත් සංගීත භාණ්ඩ වර්ගීකරණය ලියා දක්වයි.
42. සංකේත මගින් දැක්වෙන තිත් රූපය හා දක්වා ඇති බෙරපද වාදනයට සුදුසු භාණ්ඩය නම් කරයි.
43. හටන් ගීතයේ තිත සහ මුද්‍රපදය සහිත ප්‍රශස්ති ගීතයක් නම් කරයි.
44. අදාළ බෙරපදය අයත් තිත හා එය වාදනයට සුදුසු අවනද්ධ භාණ්ඩය නම් කරයි.


අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

45. සිංහල චිත්‍රපටය හා චිත්‍රපට අධ්‍යක්ෂවරයා නම් කරයි.
46. දී ඇති ගීත ඉදිරිපත් කරන ලද සංගීත කණ්ඩායම් නම් කරයි.
47. අපරදිග සංගීත භාණ්ඩ, හඬතල අනුව නම් කරයි.
48. ලෝකයෙහි භාවිත විවිධ සංගීත පද්ධති නම් කරයි.
49. අපරදිග කැන්ටාටා සංගීතය ආරම්භ වූ හා වර්ධනය වූ රටවල් නම් කරයි.
50. සංධ්වනි හා සමූහ වාදන ආකෘති අනුව නිර්මාණය කළ දේශීය සංගීතඥයින් නම් කරයි.

## II පත්‍රයේ අභිමතාර්ථ.

### 1 කොටස

(01)

(i) ස්වර සංගති අනුව රාග හඳුනා ගනියි.

(ii) රාගධාරී මධ්‍යලය ගීතයක හෝ වාදිතයක අන්තරා කොටසේ ස්වර ප්‍රස්තාර කරයි.

(iii) තානාලංකාර රටා හඳුනා ගනිමින් තාන වර්ග කරයි.

(iv) රාගවල සමාන අසමානතා ලියයි.

(02)

(i) රාග ලක්ෂණවලින් පිළිබිඹුවන රාග නම් කරයි.

(ii) රාගධාරී මධ්‍යලය ගීතයක හෝ වාදිතයක ස්ථායි කොටසේ ස්වර ප්‍රස්තාර කරයි.

(iii) ථාටයකට අයත් සම ප්‍රකෘති රාග නම්කර රාග සංගති ඇසුරින් සමාන අසමානතා ලියයි.

(iv) ස්වර ප්‍රස්තාරයේ ඇතුළත් රාග නම් කරයි.

(03)

(i) මාත්‍රා සංඛ්‍යාවන් සමාන වන තාල නම්කරයි.

(ii) තාලයක ඨේකාව සම හා දෙගුණ වශයෙන් ප්‍රස්තාර කරයි.

(iii) ගායන ශෛලීන්වලට ගැලපෙන කරුණු ලැයිස්තුවෙන් තෝරයි.

(iv) දී ඇති මාතෘකා වලට ගැලපෙන කරුණු තෝරයි.

### 11 කොටස

(04)

(i) සැවුලා වන්නමට අයත තාල රූපයේ විශේෂත්වය පැහැදිලි කරයි.

(ii) වරම් හා නෙලුම් ගී දී ඇති කරුණු ඔස්සේ විස්තර කරයි.

(iii) වන්නම් හා ප්‍රශස්ති සඳහා කර්ණාටක සංගීතයෙන් ලැබුණ බලපෑම පැහැදිලි කරයි.

(05)

(i) නාඩගම් සංගීතයේ ඇතුළත් අංග විස්තර කරයි.

(ii) නාඩගම් සංගීතය සඳහා කර්ණාටක සංගීතයෙන් ලැබුනු ආභාසය පැහැදිලි කරයි.

(iii) නූර්ති ගීතයක ස්ථායි කොටසේ ගී පද ප්‍රස්තාර කරයි.

(iv) සොකරි, කෝලම් රංග ශෛලීන්හි සමාන අසමානතා ලියා දක්වයි.

111 කොටස

(06)

(i) දී ඇති ස්වර ප්‍රස්තාරය වෙනත් ස්කේලයකට අනුව නැවත ප්‍රස්තාර කරයි.

(ii) අපරදිග සංගීතයට අදාළ මාත්‍රිකා කෙටියෙන් විස්තර කරයි.

(iii) ගී පද ප්‍රස්තාරයට යොදා ඇති කෝඩ්ස්වලට ගැලපෙන ලෙස පදමාලාවට උචිත තනුවක් ගීත ස්වර ප්‍රස්තාර කරයි.

(iv) A. අපරදිග ස්වර ප්‍රස්තාරය පෙරදිග ක්‍රමයට පෙරළා ප්‍රස්තාර කරයි.

B. පෙරදිග ස්වර ප්‍රස්තාරය අපරදිග ක්‍රමයට පෙරළා ප්‍රස්තාර කරයි.

(07)

(i) තෝරා ගත් සංගීතඥයෙකු විසින් නිර්මාණය කරන ලද චිත්‍රපට ගීතයක් දී ඇති ශීර්ෂ ඔස්සේ ඇගයීමක් කරයි.

(ii) කණ්ඩායම් සංගීතයේ ආභාසය ලැබූ චිත්‍රපට හා ගීත නම් කරයි.

(iii) ස්වතන්ත්‍ර සංගීත නිර්මාණ ඇතුළත් චිත්‍රපට හා ගීත නම් කරයි.

(iv) සරළ ගීයක් ප්‍රසාංගිකව ඉදිරිපත් කිරීමේ නව ප්‍රවණතා පිළිබඳ අදහස් දක්වයි.

(08)

(i) උතුරු ඉන්දීය සංගීතයේ දියුණුවට දායක වූ සංගීතඥයින්ගේ සේවය පැහැදිලි කරයි.

(ii) ලයනල් එදිරිසිංහ සූරීන්ගෙන් සංගීතයට සිදුවූ සේවය විස්තර කරයි.

(iii) හෙළ ගී මග කෘතිය පාසල් සංගීත අධ්‍යාපනයට දායකවී ඇති ආකාරය පැහැදිලි කරයි.

(iv) අපරදිග සංගීත භාණ්ඩවර්ගීකරණය හඳුන්වා එහි Wind instruments කොටස පිළිබඳ පැහැදිලි කරයි.

(v) කායදා, පල්ටා යන අංග විස්තර කර ත්‍රිතාලයට අදාළවන කායදාවක් සහ පල්ටාවක් තාලානුකූලව ප්‍රස්තාර කරයි.



අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාළ ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

இலங்கைப் பரீட்சைத் திணைக்களம்

## අ.පො.ස.(උ.පෙළ) විභාගය/க.பொ.த. (உயர் தர)ப் பரீட்சை - 2024

| විෂය අංකය<br>பாட இலக்கம் | 54 | විෂයය<br>பாடம் | පෙරදිග සංගීතය |
|---|---|---|---|

## ලකුණු දීමේ පටිපාටිය/புள்ளி வழங்கும் திட்டம்

## I පත්‍රය/பத்திரம் I

| ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. | ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. | ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. |
|---|---|---|---|---|---|
| 01. | 03 | 11. | 03 | 21. | 03 |
| 02. | 04 | 12. | 05 | 22. | 04/05 |
| 03. | 02 | 13. | 02 | 23. | 03 |
| 04. | 03 | 14. | 03 | 24. | 04 |
| 05. | 02 | 15. | 05 | 25. | 02 |
| 06. | 03 | 16. | 03 | 26. | 04 |
| 07. | 05 | 17. | 01 | 27. | 04 |
| 08. | 05 | 18. | 01 | 28. | 03 |
| 09. | 02 | 19. | 02 | 29. | 03 |
| 10. | 01 | 20. | 05 | 30. | 03 |

- අංක **31** සිට **50** තෙක් ප්‍රශ්නවල ඇති හිස් තැන් සඳහා සුදුසු ම පිළිතුරු යොදන්න.

**31.** 'ස්වරමේල කලානිධි' නම් කර්ණාටක සංගීත ග්‍රන්ථය ......රාමාමාත්‍ය...... විසින් රචනා කරන ලද අතර, 'ක්‍රමික් පුස්තක් මාලිකා' නම් ග්‍රන්ථය රචනා කරන ලද්දේ ......භාත්ඛණ්ඩේ...... විසිනි.

**32.** සිංහල බසින් රචිත 'භාවික ගීත' ග්‍රන්ථය ......වින්සන්ට් සෝමපාල...... විසින් රචනා කරන ලද අතර 'විශ්ව සංගීත ක්ෂේත්‍ර' නමැති ග්‍රන්ථය රචනා කරන ලද්දේ ......සී. ද එස්. කුලතිලක...... විසිනි.

**33.** ......සන්තූර්...... නමැති වාද්‍ය භාණ්ඩය වාදනයෙහි ප්‍රවීණ සංගීත ශිල්පියෙකු ලෙස ශිවකුමාර් ශර්මා හැඳින්විය හැකි අතර බිස්මිල්ලා ඛාන් ......ෂනායි/ශෂනායි/ෂහ්නායි...... නමැති වාද්‍ය භාණ්ඩ වාදනයෙහි ප්‍රවීණයෙකු ලෙස සුප්‍රසිද්ධ ය.

**34.** උත්තර භාරතීය රාගධාරී ශාස්ත්‍රීය සංගීතයෙහි භාවිතයේ පවතින අළුවෙන් (Bow) වැයෙන පර්දා රහිත භාණ්ඩ දෙකක් ලෙස ......සාරංගි......, සහ ......වයලීන්...... හැඳින්විය හැකි ය.

**35.** මසීද්ඛානි සහ ......රාසාඛානි/රාජාඛානි...... නමින් හඳුන්වනු ලබන ගත් වාදන ශෛලීන් දෙක සිතාරයෙන් වයනු ලබන අතර, එම භාණ්ඩයෙන් වයනු ලබන ......තාන/තානාලංකාරය...... , තෝඩා යන නමින් ද හඳුන්වනු ලබයි.

**36.** නිර්දේශිත රාග දෙකක් වන ......බාගේශ්‍රී...... රාගයෙන් සහ ......මාල්කෞන්ස්...... රාගයෙන් ඛ්‍යාල් ගායනය සිදුකිරීමේ දී තාම්පුරාවෙහි තත් හතර, ම̣ ස ස ස̣ ලෙස සුසර කරනු ලැබේ.

**37.** ත්‍රිතාල්, ......පංජාබි...... සහ ......තිලවඩා...... යන තාල තුන මිතියෙන් සමාන නමුත් ගතියෙන් වෙනස් වේ.

**38.** පඛාවාජය ප්‍රධාන තාල වාද්‍ය භාණ්ඩය වශයෙන් යොදා ගැනෙන ගායන ශෛලීන් ලෙස චතුරංග, ......ධෘපද්...... සහ ......ධමාර්...... හැඳින්විය හැකි ය.

- අංක **39** සිට **41** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු ලිවීම සඳහා පහත ඡේදය අදාළ කරගන්න.

"ඒකල ශාස්ත්‍රීය වාදනයක් මුඛඩාවෙන් ආරම්භ කරමින්, ගත් වාදනයෙහි යෙදුනු තාරක විසින් තිහායි කොටසින් සිය වාදනය අවසන් කරන ලදී. ගයනී විසින් එම වාදනයේ මුල සිට අවසානය දක්වා සාරංගියෙන්, |ගුම ධුනි සံ — — නි ධු ම ගුම ගුස| වශයෙන් වූ ස්වර රචනාව නැවත නැවත වාදනය කරන ලදී."

**39.** තාරක විසින් ......තබ්ලා...... නම් වාද්‍ය භාණ්ඩය වයන ලද අතර ඔහුගේ වාදනය සිදු කරන ලද්දේ නිර්දේශිත තාලයක් වන ......ජප්...... තාලය අනුව ය.

**40.** ගයනී විසින් වයන ලද ස්වර රචනාවෙහි ශුද්ධ නිෂාද ස්වරය වෙනුවට කෝමල නිෂාදය යෙදූවිට ......මාල්කෞන්ස්...... නම් රාගය පිළිඹිබු වේ. එම ස්වර රචනාව අනුව සමග්‍රහය පෙන්නුම් කිරීම සඳහා වඩාත් ම සුදුසු ස්වරය වන්නේ ......උච්ඡ සඩ්ජය/තාර සඩ්ජය...... ස්වරයයි.

**41.** හින්දුස්තානි සංගීත භාණ්ඩ වර්ගීකරණයට අනුව ඉහත ඡේදයෙහි සඳහන් තාරක විසින් වැයූ භාණ්ඩය ......අවනද්ධ...... වාද්‍ය සංඝයට ද සාරංගී භාණ්ඩය ......තත...... වාද්‍ය සංඝයට ද අයත් වේ.

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාළ ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

42. | ^1 2 | /1 2 3 4 | ^1 2 | /1 2 3 4 | මෙම තිත් රූපය ....සුළු මහ.... දෙතිතට අයත් වන අතර, | ජි ං | ජි මි ත | ත ත් | ත ක ට | යන බෙරපදය වාදනය කිරීමට සාම්ප්‍රදායික ව භාවිත කරනු ලබන්නේ ....දවුල.... නම් අවනද්ධ භාණ්ඩයයි.

43. "කපන කොටන බිම් පෙරළන" වශයෙන් ආරම්භ වන හටන් ගීතය ....මැදුම්.... තිත අනුව ගැයෙන අතර, "ලක්ෂ්මී බූජවාසා" සහ ....වරමාතී/තුරුරත්න/බානු සේගිමා.... වශයෙන් පද යෙදෙන ගීත මුද්‍රප්පදය සහිත නිර්දේශිත ප්‍රශස්ති ගීත වේ.

44. ගණපති සවුදමේ ඇතුළත් | තත් ජිත් තොන් නන් | අකු ලාඉ ගෙත සොඬ | වශයෙන් යෙදෙන බෙරපද හා පද කොටස් ....මහ.... තනි තිතට අනුව ශිල්පියා විසින් උච්චාරණය කළ පසු, එය වාදනය කර පෙන්වනුයේ ....උඩරට බෙර/මඟුල් බෙර/ගැට බෙර/.... නම් අවනද්ධ වාද්‍ය භාණ්ඩයෙනි.

45. "සිරිනි සරුසර විලා" ගීතය ....මාතලන්.... චිත්‍රපටයට අයත් වන අතර එහි සංගීත අධ්‍යක්ෂණය කර ඇත්තේ ....ආර්. මුත්තුසාමි.... විසිනි.

46. මෙරට කණ්ඩායම් සංගීතය හා සම්බන්ධයෙන් විමසා බලන විට "නැළවෙන මව් උකුළේ" ගීතය ....සමනලයෝ.... නමැති සංගීත කණ්ඩායම විසින් ද, "මූළු ගතම වෙහෙසුනා" ගීතය ....මී මැස්සෝ.... නමැති සංගීත කණ්ඩායම විසින් ද ඉදිරිපත් කර ඇත.

47. වයෝලා වාද්‍ය භාණ්ඩය අපරදිග සංගීතයේ ....ඇල්ටෝ/Alto.... හඬ තලයට අයත් වන අතර එම තන්ත්‍රීය භාණ්ඩ වර්ගීකරණය (String Family) අනුව ....ඩබල් බේස්/බේස් ගිටාර්.... වාද්‍ය භාණ්ඩය බේස් (Bass) හඬ තලයට අයත් වේ.

48. ලෝකයෙහි භාවිත වන විවිධ සංගීත පද්ධති පහක් හඳුනාගෙන ඇත. එනම් භාරතීය, අපරදිග, ....චීන...., ඉස්ලාමීය සහ ....ගම්ලෑන්.... වශයෙනි.

49. අපරදිග කැන්ටාටා සංගීතාංගයේ ආරම්භය සහ වර්ධනය යන කාරණා දෙකම සිදු වී ඇත්තේ යුරෝපා මහාද්වීපයට අයත් රටවල් දෙකක් වන ....ජර්මනියේ.... දී සහ ....ඉතාලියේ.... දී ය.

50. සංධ්වනි ආකෘතිය හෝ සමූහ වාදන ආකෘතිය අනුගමනය කරමින් සංගීතඥ ලයනල් එදිරිසිංහයන් විසින් ....පන්සිළු.... නමින් නිර්මාණයක් සිදු කර ඇති අතර "මගේ කාලයේ මව්නි" යන තේමාවෙන් සමූහ වාදනයක් නිර්මාණය කරන ලද්දේ ....ප්‍රේමසිරි කේමදාස.... නමැති සංගීතඥයා විසිනි.

***

## අ.පො. ස (උසස් පෙළ) විභාගය - 2024
## පෙරදිග සංගීතය II පත්‍රයේ අභිමතාර්ථ

### I කොටස

(01)

(i) ස්වර සංගති අනුව රාග හඳුනා ගනියි.

(ii) රාගධාරී මධ්‍යලය ගීතයක හෝ වාදිතයක අන්තරා කොටසේ ස්වර ප්‍රස්තාර කරයි.

(iii) තානාලංකාර රටා හඳුනා ගනිමින් තාන වර්ග කරයි.

(iv) රාගවල සමාන අසමානතා ලියයි.

(02)

(i) රාග ලක්‍ෂණවලින් පිළිබිඹුවන රාග නම් කරයි.

(ii) රාගධාරී මධ්‍යලය ගීතයක හෝ වාදිතයක ස්ථායි කොටසේ ස්වර ප්‍රස්තාර කරයි.

(iii) ථාටයකට අයත් සම ප්‍රකෘති රාග නම්කර රාග සංගති ඇසුරින් සමාන අසමානතා ලියයි.

(iv) ස්වර ප්‍රස්තාරයේ ඇතුළත් රාග නම් කරයි.

(03)

(i) මාත්‍රා සංඛ්‍යාවන් සමාන වන තාල නම්කරයි.

(ii) තාලයක ඨේකාව සම හා දෙගුණ වශයෙන් ප්‍රස්තාර කරයි.

(iii) ගායන ශෛලීන්වලට ගැලපෙන කරුණු ලැයිස්තුවෙන් තෝරයි.

(iv) දී ඇති මාතෘකා වලට ගැලපෙන කරුණු තෝරයි.

### II කොටස

(04)

(i) සැවුලා වන්නමට අයත තාල රූපයේ විශේෂත්වය පැහැදිලි කරයි.

(ii) වරම් හා නෙලුම් ගී දී ඇති කරුණු ඔස්සේ විස්තර කරයි.

(iii) වන්නම් හා ප්‍රශස්ති සඳහා කර්ණාටක සංගීතයෙන් ලැබුණ බලපෑම පැහැදිලි කරයි.

(05)

(i) නාඩගම් සංගීතයේ ඇතුළත් අංග විස්තර කරයි.

(ii) නාඩගම් සංගීතය සඳහා කර්ණාටක සංගීතයෙන් ලැබුනු ආභාසය පැහැදිලි කරයි.

(iii) නූර්ති ගීතයක ස්ථායි කොටසේ ගී පද ප්‍රස්තාර කරයි.

(iv) සොකරි, කෝලම් රංග ශෛලීන්හි සමාන අසමානතා ලියා දක්වයි.



අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

## III කොටස

(06)

(i) දී ඇති ස්වර ප්‍රස්තාරය වෙනත් ස්කේලයකට අනුව නැවත ප්‍රස්තාර කරයි.

(ii) අපරදිග සංගීතයට අදාළ මාතෘකා කෙටියෙන් විස්තර කරයි.

(iii) ගී පද ප්‍රස්තාරයට යොදා ඇති කෝඩ්ස්වලට ගැලපෙන ලෙස පදමාලාවට උචිත තනුවක් ගීත ස්වර ප්‍රස්තාර කරයි.

(iv) A. අපරදිග ස්වර ප්‍රස්තාරය පෙරදිග ක්‍රමයට පෙරළා ප්‍රස්තාර කරයි.

B. පෙරදිග ස්වර ප්‍රස්තාරය අපරදිග ක්‍රමයට පෙරළා ප්‍රස්තාර කරයි.

(07)

(i) තෝරා ගත් සංගීතඥයෙකු විසින් නිර්මාණය කරන ලද චිත්‍රපට ගීතයක් දී ඇති ශීර්ෂ ඔස්සේ ඇගයීමක් කරයි.

(ii) කණ්ඩායම් සංගීතයේ ආභාසය ලැබූ චිත්‍රපට හා ගීත නම් කරයි.

(iii) ස්වතන්ත්‍ර සංගීත නිර්මාණ ඇතුළත් චිත්‍රපට හා ගීත නම් කරයි.

(iv) සරළ ගීයක් ප්‍රසාංගිකව ඉදිරිපත් කිරීමේ නව ප්‍රවණතා පිළිබඳ අදහස් දක්වයි.

(08)

(i) උතුරු ඉන්දීය සංගීතයේ දියුණුවට දායක වූ සංගීතඥයින්ගේ සේවය පැහැදිලි කරයි.

(ii) ලයනල් එදිරිසිංහ සූරීන්ගෙන් සංගීතයට සිදුවූ සේවය විස්තර කරයි.

(iii) හෙළ ගී මග කෘතිය පාසල් සංගීත අධ්‍යාපනයට දායකවී ඇති ආකාරය පැහැදිලි කරයි.

(iv) අපරදිග සංගීත භාණ්ඩවර්ගීකරණය හඳුන්වා එහි Wind instruments කොටස පිළිබඳ පැහැදිලි කරයි.

(v) කායදා, පල්ටා යන අංග විස්තර කර ත්‍රිතාලයට අදාළවන කායදාවක් සහ පල්ටාවක් තාලානුකූලව ප්‍රස්තාර කරයි.

## පෙරදිග සංගීතය

## II පත්‍රය - I කොටස

### ප්‍රශ්න අංක 01

**(i)** රාග හතර හඳුනාගෙන අදාළ ඉංග්‍රීසි අක්ෂරය සමග නිවැරදිව නම් කිරීමට

එක් රාගයකට ලකුණු 01 බැගින් = ල. 04

**(ii)** ඛ්‍යාල් මධ්‍යලය ගීතයක හෝ වාදිතයක අන්තරා කොටස ආරම්භයේ සිට ආවර්ත දෙකක් සඳහා පමණක් ලකුණු පිරිනැමේ.

✶ (ආදර්‍ශ සඳහා ආවර්ත 4ක් අදාල කරගන්න - රූපක් සඳහා පළමු විභාගයට ලකුණු 01 කි.)

- නිවැරදි එක් විභාගයකට ලකුණු ½ බැගින් ආවර්ත දෙකට (ලකුණු ½× 8)= ලකුණු 04
- තාල සංකේත දැක්වීම සඳහා ලකුණු 01 කි. = ලකුණු 01
- සමස්ත ස්වර ප්‍රස්තාරික කුසලතා පෙන්නුම් කිරීම සඳහා ලකුණු 01 කි = ලකුණු 01

} = ල. 06

**(iii)** තාන වර්ග හතර නිවැරදිව නම්කර තිබීමට ලකුණු (ලකුණු 1× 4) = ල. 04

**(iv)**

- දේස් හා ජයජයවන්ති රාග දෙකේ සමානතා දෙකට එක් කරුණකට

  ල.01 බැගින් (ලකුණු 1× 2) = ලකුණු 02

- අසමානතා හතරට එක් කරුණකට ල. 01 බැගින් (ල. 1× 4) = ලකුණු 04

} = ල. 06

❖ **සුවිශේෂී අවධානය සඳහා (සැලකිල්ලට ගත යුතුය.)**

(1) - (i) කොටසට අදාළව

- A B C D කොටස් 4 සඳහා නිවැරදිව රාග නම් කර ඇති විට ලකුණු 04 හිමිවේ.
- A B C D කොටස් 4 න් ඕනෑම තුනකට (3 කට පමණක්) නිවැරදිව රාග නම් කර ඇති විට අමතර ලකුණක් ද සහිතව ලකුණු 4 ක් හිමිවේ.
- B (භෛරව) C (බාගේශ්‍රී) කොටස් දෙක සඳහා නිවැරදිව රාග නම් කර, ඊට අමතර වශයෙන් (A සහ C සඳහා) දේස් රාගය ලෙසද නම් කර පිළිතුරු සපයා ඇති විටක - ලකුණු 4 ම හිමි වේ. (B හෝ C සඳහා) පිළිතුරු වැරදි අවස්ථාවක වුව ද, අමතර වශයෙන් දේස් රාගය ලෙස ද පිළිතුරු ලියා ඇත්නම් එම පිළිතුරට (දේස්) ලකුණු - 02 ක් හිමිවේ.

(1)-(ii) කොටස සඳහා ස්වර ප්‍රස්තාර කිරීමට අදාළව - ජයජයවන්ති/භෛරව/බාගේශ්‍රී රාග වලට අමතරව දේස් රාගය ද (ඉහත i කොටසට නම් කළ අපේක්ෂකයින් සඳහා පමණක් අදාළ කර ගන්න.) යන රාග 4 න් ඕනෑම රාගයයක් තෝරා ගෙන තිබිය හැකි වේ.



අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

**1.** පහත දැක්වෙනුයේ නිර්දේශිත රාග තුනකට අයත් පූර්වාංගයේ යෙදෙන ස්වර සංගති කිහිපයකි.

A- ම ග රි ගු රි නි ස
B - ග ම රි රි ස ග ම
C - ස ගු ම ම ගු රි ස
D - ස රි ප ම ග ස නි

(i) ඉහත ස්වර සංගතීන් අයත් වන රාග හඳුනාගෙන, අදාළ ඉංග්‍රීසි අක්ෂරය සමග නම් කරන්න. (ලකුණු 04 යි.)

(ii) ඉහත A, B සහ C හි ඇතුළත් සංගති මගින් පිළිබිඹු වන රාග තුනෙන් කැමති රාගයකට අදාළ ඛ්‍යාල් මධ්‍යලය ගීතයෙහි හෝ වාදිතයෙහි අන්තරා කොටස ස්වර ප්‍රස්තාර කරන්න. (ලකුණු 06 යි.)

(iii) හංසධ්වනි රාගයට අදාළ පහත සඳහන් තානාලංකාර හතර අයත් වන තාන වර්ග හතර, වරහන් තුළ දී ඇති ලැයිස්තුවෙන් තෝරා අදාළ අංක ද සමග ලියන්න.

(අලංකාරික තාන, බෝල් තාන, ශුද්ධ තාන, මිශ්‍ර තාන, කූට තාන)

(1) ගරි ගප රිග නිප ගස රිග නිස පස
(2) ගප නිස් රිග් පග් රිස් නිප ගරි ස–
(3) ගග රිග පප ගප නිනි පනි ස්ස් නිස්
(4) සරි ගප රිග පනි ගප ස්නි පග රිස (ලකුණු 04 යි.)

(iv) නිර්දේශිත රාග විස්තර අනුව, දේස් සහ ජයජයවන්ති රාග දෙකෙහි සමානතා **දෙකක්** සහ අසමානතා **හතරක්** ලියන්න. (ලකුණු 06 යි.)

✶ (ලකුණු නිර්ණය කිරීමේ දී ඉහත කොටුකර දක්වා ඇති උපදෙස් ද අනුගමනය කරන්න)

**(i)**

A. ජයජයවන්ති රාගය
B. භෛරව රාගය
C. බාගේශ්‍රී රාගය
D. තිලක්කාමෝද් රාගය

**(ii)** ජයජයවන්ති, භෛරව, බාගේශ්‍රී සහ ඊට අමතර වශයෙන් දේස් රාගය ද අතරින් එක් රාගයකට අයත් ඛ්‍යාල් මධ්‍යලය ගීතයක හෝ වාදිතයක අන්තරා කොටසේ ආවර්ත දෙකක් සඳහා පමණක් ලකුණු පිරිනැමේ.
(දාදරා සඳහා ආවර්ත 4ක් අදාල කරගන්න - රූපක් සඳහා පළමු විභාගයට ලකුණු 01 කි.)

**(iii)** 1. කූට තාන 2. ශුද්ධ තාන 3. අලංකාරික තාන 4. මිශ්‍ර තාන

**(iv)** දේස් සහ ජයජයවන්ති රාග දෙකෙහි

**සමානතා**

- රාග දෙකෙහිම මේලය ඛමාජ් ලෙස සැලකේ.
- රාග දෙකෙහිම ජාතිය සම්පූර්ණවේ.
- රාග දෙකෙහිම වාදී හා සංවාදී ස්වර පිළිවෙලින් රිෂභය හා පංචමය වේ.
- ගානසමය රාග දෙකෙහිම රාත්‍රී දෙවන ප්‍රහරය වේ.
- රාග දෙකම පූර්වාංගවාදී රාග වේ.
- රාග දෙකෙහිම ආරෝහණයේ ශුද්ධ නිශාදයත් අවරෝහණයේ කෝමළ නිශාදයත් යෙදේ.
- රාග දෙකෙහිම වක්‍ර ස්වර යෙදේ. (දේස් - රිෂභ් / ජයජයවන්තී - පංචම)
(මීට අමතර වශයෙන් ඉදිරිපත් කර ඇති නිවැරදි පිළිතුරු ද සලකා බලන්න)

**අසමානතා**

- ජයජයවන්ති රාගය පරමේල ප්‍රවේශක රාගයක් වන අතර දේස් රාගය එසේ නොවේ.
- දේස් රාගයේ ආරෝහණය ස රි ම ප නි සං සහ අවරෝහණය සං නි ධ ප මග රිගස ලෙස යෙදෙන අතර
  ජයජයවන්ති රාගයේ ආරෝහණය ස රි රි, රිගු රිස, නිධප, රි,ගමප, නිසං සහ අවරෝහණය සංනිධප, ධම, රිගු රිස ලෙස යෙදේ.
- දේස්රාගයේ මුඛ්‍යාංගය රිමප,නිධප, පධපම, ගරිගස වන අතර ජයජයවන්ති රාගයේ මුඛ්‍යාංගය රිගු රිස, නිධප, රි ලෙස යෙදේ.
- දේස් රාගයේ ශුද්ධ ගාන්ධාරය ආංගිකව යෙදෙන අතර කෝමළ ගාන්ධාරය විවාදීව යෙදේ. ජයජයවන්ති රාගයේ ශුද්ධ ගාන්ධාර හා කෝමළ ගාන්ධාර යන දෙකම ආංගිකව යෙදේ.
- දේස් රාගයේ විවාදි ස්වරයක් ලෙස කෝමළ ගාන්ධාරය රිෂභයන් දෙකකට මැදිව යෙදෙන අතර ජයජයවන්ති රාගයේ රිෂභයන් දෙකකට මැදිව කෝමල ගාන්ධාරය ආංගිකව යෙදේ.
- දේස් රාගයේ රිෂභය වක්‍ර වන අතර ජයජයවන්ති රාගයේ එසේ නොයෙදේ.
- රාග දෙකෙහි යෙදෙන සංගතීන් හි වෙනසක් ද ඇත.
  (**දේස් රාගයේ ස්වර සංගති** - ස,රිමප, නිධප, පධ මගරි, මපනිසං, පනිසංරිං සංනිධප, (ප) මගරි, රිගස)
  (**ජයජයවන්ති රාගයේ ස්වර සංගති** - සරිරි , රිගු රිස , නිසධනි රි , රිගමප, මපනිසං, සංනිධප ධමග, මග රිගු රිස, නිධප රි)
  (මීට අමතර වශයෙන් ඉදිරිපත් කර ඇති නිවැරදි පිළිතුරු ද සලකා බලන්න)

**ප්‍රශ්න අංක 02**

**(i)** රාග ලක්ෂණ මගින් පිළිබිඹු වන රාගවල නම් අදාළ ඉංග්‍රීසි අක්ෂරයද සමග ලිවීමට
එක් පිළිතුරකට ලකුණු 1 බැගින් (ල. 1×4) = ල. 04

**(ii)** දේස්, හංසධ්වනි, ආසාවරි යන රාග අතුරෙන් කැමති ඛ්‍යාල් මධ්‍යලය ගීතයක හෝ වාදිතයක අන්තරා කොටස ආරම්භයේ සිට ආවර්ත දෙකක් සඳහා පමණක් ලකුණු පිරිනැමේ.

✶ (දාදරා සඳහා ආවර්ත 4ක් අදාල කරගන්න - රූපක් සඳහා පළමු විභාගයට ලකුණු 01 කි.)

- නිවැරදි එක් විභාගයකට ල. ½ බැගින් ආවර්ත දෙකකට ලකුණු (½×8) = ල. 04
- තාල සංකේත දැක්වීම සඳහා ලකුණු 01 කි = ල. 01
- සමස්ත ස්වර ප්‍රස්තාරික කුසලතා පෙන්නුම් කිරීම සඳහා ලකුණු 01 කි = ල. 01

} ල. 06

**(iii)** සමප්‍රකෘති රාග යුගලය නිවැරදිව නම් කිරීමට (දේස් - තිලක්කාමෝද්) = ල. 01

- රාග දෙකෙහි අසමානතා දෙක පැහැදිලි කිරීමට = ල. 02
- උදාහරණ ලෙස රාග සංගති දෙක නිවැරදිව පෙන්නුම් කිරීමට = ල. 02

} ල. 05

**(iv)**

- A B C D E අක්ෂර වලට අදාළ වන රාග 5 නිවැරදිව නම් කිරීම සඳහා
  එක් රාගයකට ලකුණු 1 බැගින් ල. (1×5) = ල. 05



අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාළ ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

**2.** (i) පහත දී ඇති එක් එක් ලක්ෂණය මගින් පිළිබිඹු වන රාගවල නම් අදාළ ඉංග්‍රීසි අක්ෂරය ද සමග ලියා දක්වන්න.

A - ධ පම ග ම ග, නි ස රි ග ම වශයෙන් මුඛ්‍යාංගය යෙදෙන රාගයක් වේ.

B - භෛරවී මේලගත ඖඩව ජාතියට අයත් රාගයක් වේ.

C - ආරෝහණයේ 'ග' සහ 'ධ' ස්වර දුර්වලව යෙදෙන, අවරෝහණයේ රිෂභය වක්‍රවන රාගයක් වේ.

D - ආසාවරී ථාටයට අයත් ෂාඩව-සම්පූර්ණ ජාති රාගයක් වේ. (ලකුණු 04 යි.)

(ii) දේස්, හංසධ්වනි, ආසාවරී යන රාග අතුරෙන් කැමති රාගයකට අදාළ බ්‍යාල් මධ්‍යලය ගීතයෙහි හෝ වාදිතයෙහි ස්ථායි කොටස ස්වර ප්‍රස්තාර කරන්න. (ලකුණු 06 යි.)

(iii) නිර්දේශිත රාග අතුරෙන් බමාජ් ථාටයට අයත් සමප්‍රකෘති රාග යුගලය නම් කර, එම රාග දෙකෙහි අසමානතා **දෙකක්** රාග සංගති ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි.)

(iv) පහත සඳහන් ස්වර ප්‍රස්තාරය නිර්දේශිත රාග පහක් ආශ්‍රයෙන් නිර්මාණය කර ඇත.

| ① | ② | ③ | ④ |
|---|---|---|---|
| රි ම ප සං | ධ – ධ ප | මග ම රි ස | ම ධ නි ධ |
| ⑤ | ⑥ | ⑦ | ⑧ |
| සං – නි ධ | ප මග රිග ස | පනි සරි ගරි සරි | ගරි ගප නිප නිසං |

ඉහත එක් එක් විභාගයට යොදා ඇති අංක ආශ්‍රයෙන් පහත ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.

A ① සහ ② විභාග බද්ධ වීමෙන් පිළිබිඹුවන රාගය නම් කරන්න.

B ② සහ ③ විභාග බද්ධ වීමෙන් පිළිබිඹුවන රාගය නම් කරන්න.

C ④ සහ ⑤ විභාග බද්ධ වීමෙන් පිළිබිඹුවන රාගය නම් කරන්න.

D ⑤ සහ ⑥ විභාග බද්ධ වීමෙන් පිළිබිඹුවන රාගය නම් කරන්න.

E ⑦ සහ ⑧ විභාග බද්ධ වීමෙන් පිළිබිඹුවන රාගය නම් කරන්න. (ලකුණු 05 යි.)

**(i)** රාග 04 හඳුනාගෙන අදාළ ඉංග්‍රීසි අක්ෂරය සමග නම් කිරීම

A. කාලිංගඩා රාගය
B. මාලකෞන්ස් රාගය
C. දේස් රාගය
D. ජෞනපුරි රාගය

**(ii)** දේස්, හංසධ්වනි සහ ආසාවරී යන රාග තුනෙන් එක් රාගයකට අයත් බ්‍යාල් මධ්‍යලය ගීතයක හෝ වාදිතයක ස්ථායි කොටසේ ආවර්ත දෙකක් සඳහා පමණක් ලකුණු පිරිනැමේ.
(දාදරා සඳහා ආවර්ත 4ක් අදාල කරගන්න - රූපක් සඳහා පළමු විභාගයට ලකුණු 01 කි.)

**(iii)** දේස් - තිලක්කාමෝද්

<u>**අසමානතා**</u>

- දේස් රාගයෙහි නිසරිමගරි, ලෙස සංගති යෙදෙන අතර, තිලක්කාමෝද් රාගයේ දී පනිසරි ග ස , ලෙස සුවිශේෂීව යොදා ගැනේ.
- දේස් රාගයේ මුඛ්‍යාංගය "රිමප,නිධප, පධපම, ගරිගස" වන අතර තිලක්කාමෝද් රාගයේ "පනිසරිගස, රිපමග, සරිග,සනි" ලෙස මුඛ්‍යාංගය යෙදේ.
- දේස් රාගයේ සනිධප ලෙස අවරෝහණයේ කෝමල නිශාදය යෙදෙන නමුත් තිලක්කාමෝද් රාගයේ කෝමල නිශාදය නොමැතිව සං, පධමග වශයෙන් යෙදේ.
- දේස් රාගයේ රිමපනිසං ලෙස ස්වර යෙදෙන අතර තිලක්කාමෝද් රාගයේ රිමපධ මපසං වශයෙන් යෙදේ.
- දේස් රාගයෙහි පධ මගරි වශයෙන් රිෂභයෙහි විශ්‍රාන්ති යෙදෙන නමුත් තිලක්කාමෝද් රාගයෙහි පධ මග ලෙස ගාන්ධාරයෙහි විශ්‍රාන්ති යෙදේ.
- තිලක්කාමෝද් රාගයෙහි රි ප සංගතිය රිගරිප මග, ලෙස සුවිශේෂීව යොදන නමුත් දේස් රාගයෙහි රි ප සංගතිය සුවිශේෂීව යොදා නොගැනේ.

(iv)

A. ආසාවරී රාගය / ජෞනපුරි රාගය
B. භෛරව රාගය
C. බාගේශ්‍රී රාගය
D. දේස් රාගය
E. හංසධ්වනි රාගය

**ප්‍රශ්න අංක 03**

(i)

- ඒ ඒ මාත්‍රා සංඛ්‍යාවන්ට අදාළව තාල දෙක බැගින් නම් කිරීමේ දී, එක් නිවැරදි තාලයකට ලකුණු ½ බැගින් (6×½) = ල. 03

(ii)

- තාල සංඥා නිවැරදිව යෙදීම සඳහා (එක් අවස්ථාවකදී ප්‍රමාණවත්ය) = ල. 01
- දීප්චන්දි තාලයේ හෝ ධමාර් තාලයේ හෝ ඒකාව සම ගුණය නිවැරදිව ප්‍රස්තාර කිරීම සඳහා එක් විභාගයකට ලකුණු ½ බැගින් (½×විභාග 4) = ල. 02
- දෙගුණය නිවැරදිව ප්‍රස්තාර කිරීම සඳහා එක් විභාගයකට ලකුණු ½ බැගින් (½×විභාග 4) = ල. 02

(මුළු) ල. 05

(iii) A B C D E F හි නිවැරදි එක් පිළිතුරකට ලකුණු 01 බැගින් (1 ×6) = ල. 06

(iv) එක් කරුණකට අදාළ පිළිතුරකට ලකුණු 02 බැගින් හිමිවේ.
(අදාළ කරුණ පැහැදිලි කිරීමට ල. 01 යි. උදාහරණ දැක්වීමට ල. 01 යි වශයෙනි)
ඒ අනුව කරුණු 03 ක් සඳහා නිවැරදි පිළිතුරු සැපයීමට (ල. 2 ×3) = ල. 06

3. (i) ඒක්තාල්, තිලවාඩා, ධමාර්, පංජාබි, චෞතාල්, ජප්තාල් සහ දීප්චන්දි යන තාල අතුරෙන් පහත සඳහන් මාත්‍රා සංඛ්‍යාවන්ගෙන් යුක්ත තාල දෙක බැගින් නම් කරන්න.
(1) මාත්‍රා 14 (2) මාත්‍රා 12 (3) මාත්‍රා 16 (ලකුණු 03 යි.)

(ii) ඉහත තාල අතුරෙන් මාත්‍රා 14 කින් යුත් තාලයක ඒකාව, සමගුණ සහ දෙගුණ වශයෙන් තාල සංඥා සහිතව ප්‍රස්තාර කරන්න. (ලකුණු 05 යි.)

(iii) පහත දක්වා ඇති එක් එක් ගායන ශෛලීන් සඳහා වඩාත් ගැළපෙන කරුණු වරහන් තුළ දී ඇති ලැයිස්තුවෙන් තෝරා අදාළ ඉංග්‍රීසි අක්ෂරය ඉදිරියෙන් ලියා දක්වන්න.
(විලම්බලය ඒක්තාල්, ජග්ජිත් සිං, කබීර් දාස්, හෝරි, අමීර් ඛුස්රු, අනුපල්ලවි, චෞතාල්)
(A) ධ්‍රැපද් (B) බඩාඛ්‍යාල් (C) භජන්
(D) ධමාර් (E) ගසල් (F) තරාණා (ලකුණු 06 යි.)

(iv) පහත කරුණු තුනක් උදාහරණ සහිතව කෙටියෙන් පැහැදිලි කරන්න.
(1) ගානසමය (2) ආලාප (3) තිහායි (4) වාදි-සංවාදි (ලකුණු 06 යි.)

(i) (1) මාත්‍රා 14 බැගින් යෙදෙන තාල - දීප් චන්දි, ධමාර්
(2) මාත්‍රා 12 බැගින් යෙදෙන තාල - ඒක් තාල්, චෞතාල්
(3) මාත්‍රා 16 බැගින් යෙදෙන තාල - තිලවඩා, පංජාබි


අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

**(ii)** දීප්චන්දි තාලය හෝ ධමාර් තාලය හෝ සම දෙගුණ වශයෙන් නිවැරදිව ප්‍රස්ථාර කර තිබිය යුතුය. නිවැරදිව තාල සංඥා යොදා තිබිය යුතුය. (එක් අවස්ථාවක ප්‍රමානවත්ය)

**(iii)** A ධ්‍රැපද් - චෞතාලය
B බඩා ඛ්‍යාල් - විලම්භලය ඒක් තාල්
C භජන් - කබීර් දාස්
D ධමාර් - හෝරි
E ගසල් - ජග්ජිත් සිං
F තරාණා - අමීර් ඛුෂ්රු

**(iv)** අදාළ කරුණු කෙටියෙන් අදහස මතුවන ලෙස උදාහරණයක් සහිතව පැහැදිලි කිරීම ප්‍රමාණවත්ය. (පහතින් දක්වා ඇත්තේ ආදර්ශ පිළිතුරුය.)

(1) <u>ගාන සමය</u>
රාගයක් ගායනයට නියම වී ඇති කාලය ගාන සමය ලෙස සැලකේ. හින්දුස්ථානී රාගධාරී සංගීතයේදී රාග ගායනයට/ වාදනයට වඩාත් සුදුසු කාල සීමාවන් වෙන් කර ඇත.

- දිනයේ පැය 24 කොටස් 8 කට දිවා හා රාත්‍රී වශයෙන් ප්‍රහර ලෙස වෙන් කොට ඇති ආකාරය උදාහරණයකින් පෙන්නුම් කිරීම.
- කිසියම් රාගයක ගායන සමය උදාහරණ ලෙස දක්වා තිබීම.

(2) <u>ආලාප</u>
යම් කිසි රාගයකට අදාළව ස්වර සංගති යොදා ගනිමින් කරනු ලබන දීර්ඝ ස්වර විස්තාරය ආලාප ලෙස හඳුන්වයි. (රාගයක් ආරම්භයේදී රාගය හඳුන්වා දීම සඳහාත්, පදනමක් ඇතිකර ගැනීම සඳහාත් ආලාප ගායනය/වාදනය සිදුවේ.)

- උදාහරණ ලෙස පූර්වාලාප හා මධ්‍ය ආලාප වශයෙන් ගායනය කරන බව හෝ ආලාප සිදු කරන ආකාරය අනුව වර්ග කිහිපයක් ඇති බව හෝ සඳහන් කිරීම ප්‍රමාණවත්ය. (ආකාර් ආලාප, නෝම් තෝම් ආලාප, සර්ගම් ආලාප, බෝල් ආලාප, ජෝඩ් ආලාප ආදී වශයෙනි.) එමෙන්ම කිසියම් රාගයකට අනුව කෙටි ආලාප ඛණ්ඩයක් ලියා පෙන්වීම ද උදාහරණ ලෙස පෙන්නුම් කර තිබිය හැකිය.

**(3)** <u>**තිහායි**</u>
තාල වාදනයේ දී මෙය ප්‍රධාන ලෙස භාවිත වේ. යම්කිසි තාල පද / ස්වර /ගීතාංග/තාල අක්ෂර කොටසක් සමාන ආකාරයට තෙවරක් ගායනය/වාදනය කර සමස්ථානයට පැමිණීම තිහායි ලෙස සැලකේ.
(උදාහරණ ලෙස - තාල අක්ෂර හෝ ස්වර අක්ෂර හෝ ගීත කොටසකට අදාල හෝ ප්‍රබන්ධයක් තිහායි ලෙස යෙදෙන ආකාරයට ලියා පෙන්නුම් කර තිබිය හැකිය.)

**(4)** <u>**වාදී - සංවාදී**</u>

වාදී - රාගයක වැඩි වශයෙන් යෙදෙන ප්‍රධාන ස්වරය වාදී ස්වරය ලෙස හැඳින්වේ. (මෙය ජීව ස්වරය/අංශ ස්වරය ලෙස ද හඳුන්වයි).

- උදාහරණ ලෙස - එක් රාගයක වාදී ස්වරය ලියා දැක්වීම ප්‍රමාණවත්ය.

සංවාදී - රාගයක වාදී ස්වරයට පසුව ප්‍රබලව යෙදෙන ස්වරය සංවාදී ස්වරයයි. (මෙය රාගයක වාදී ස්වරයේ සිට හතරවන හෝ පස්වන ස්වරය ලෙස පෙන්නුම් කරයි).

- උදාහරණ ලෙස - එක් රාගයක සංවාදී ස්වරය ලියා දැක්වීම ප්‍රමාණවත්ය.

## II කොටස

**ප්‍රශ්න අංක 04**

**(i)**

- සැවුලා වන්නමේ තාල රූපය විභාග කිරීමට ල. 01 සහ තිත් සලකුණු නිරවද්‍යතාවයට ලකුණු 01 වශයෙන් = ල. 02 කි.
- තාල රූපයේ විශේෂත්වය පැහැදිලි කිරීමට = ල. 02 කි.
  (දළ වශයෙන් පැහැදිලි කර ඇතිවිටෙක ලකුණු 01 ක ද, වඩාත් අතිවත්ව පැහැදිලි කර ඇතිවිටක ලකුණු 01ක් ද වශයෙනි.)

} ල. 04

**(ii)**

- වරම් ගීතයේ හා නෙලුම් ගීතයේ මුල්පාද වෙන් වශයෙන් ලිවීමට එකකට ලකුණු 01ක බැගින් = (1×2) ල. 02
- එක් ගී වර්ගයක නාද රටා, රිද්මය හා භාෂාව පිළිබඳ නිදසුන් සමග ලිවීමට (විස්තර කිරීමට 01 බැගින් සහ නිදසුනට 01 බැගින්) = (2×3) ල. 06

} ල. 08

**(iii)**

- වන්නම් සහ ප්‍රශස්ති යන ගී වර්ග දෙකෙන්ම කරුණු හතරක් පැහැදිලි කිරීමට = ලකුණු 04
- එම කරුණු සඳහා උදාහරණ හතරක් සැපයීමට = ලකුණු 04

} ල. 08

**4.** (i) සැවුලා වන්නම අයත් වන තාල රූපයේ මාත්‍රා විභාග වන ආකාරය අංක වශයෙන් ප්‍රස්තාර කර, එම තාල රූපයේ විශේෂත්වය පැහැදිලි කරන්න. (ලකුණු 04 යි.)

(ii) නිර්දේශිත 'වරම්' ගීතයක සහ 'ඕසය සහිත නෙළුම්' ගීතයක මුල් ගී පාදය බැගින් වෙන වෙන ම ලියා, එම එක් ගී වර්ගයක් පිළිබඳ ව පහත කරුණු යටතෙහි නිදසුන් සහිතව විස්තර කරන්න.

- නාද රටා
- රිද්මය
- භාෂාව

(ලකුණු 08 යි.)

(iii) මෙරට සංගීතය පෝෂණය වීම සඳහා මහනුවර යුගයේ දී කර්ණාටක සංගීතයෙන් සිදු වූ බලපෑම වන්නම් සහ ප්‍රශස්ති ඇසුරෙන් නිදසුන් දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 08 යි.)

```
    ʌ       /         ʌ      /
(i) / 1  2 / 1 2 3 4 / 1 2 / 1 2 3 4 /
```

- සුළු මහ දෙතිතට සමාන තාල රූපයක් හින්දුස්ථානි සංගීතයේ නොමැති වීම.
- මාත්‍රා දෙක හතර වශයෙන් කැටීවීම නිසා නාදමාලාව ගාම්භීර ස්වරූපයක් ගැනීම.

**(ii) <u>වරම් ගී</u>**

- වරම් වරම් සකු මහ බඹු අතින් වරම්
- අවර උදය පායන හිරු දෙවිගෙ වරම්



අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

**නාද රටා**

- ස්වර පරාසය පටු වීම
  උදාහරණ - වරම් වරම් සක්‍ර මහ බඹු....(නි් සිට ම දක්වා ස්වර නාද රටාවට ඇතුළත්ව තිබීම)
- ඒකාකාරී නාද මාලාවකින් යුක්ත වීම
- ඉහල ශ්‍රැතියකින් යුක්ත වේ.
- සාමූහිකව ගායනා කරයි.
- කෝමල ශුද්ධ දෙයාකාරයෙන්ම නාද මාලා නිර්මාණය වී තිබීම

**රිද්මය**

- බොහෝ දුරට මැදුම් තනි තිතට අනුව ගායනාවේ.
- රිද්ම රටාව තරමක වේගවත් බවක් උසුලයි.
- ගීත ගායනා ආඝාතාත්මක වේ.

**භාෂාව**

- සරල බසකින් යුක්තය.
- ගැමි භාෂාව යොදාගෙන ඇත.
- බස හැසිරවීමේදී එළිවැට ගැන වැඩි අවධානයක් යොමු කර ඇත.

උදාහරණ -
වරම් වරම් සක්‍ර මහ බඹු අතින් වරම්
වරම් වරම් ඉර සඳ දෙවි අතින් වරම්

- අන්තර්ගතය තුළ ආගමික සිතුවිලි , දෙවියන්ගෙන් අවසර ඉල්ලීම් හා පිහිට පැතීම් අඩංගු වේ

(ඉහත කරුණු විස්තර කිරීමේ දී අවම වශයෙන් එක් උදාහරණයක් පමණක් සෑහේ).

**නෙළුම් ඕසය**

- තේමිය ජාතියේ බෝසත් උපන්නේ
- දේවතා දුවක් ඇවිදින් කියන්නේ

**නාද රටා**

- සරල නාද මාලාවකින් යුක්ත වීම.
  (උදාහරණ - දේවතා දුවක්....(ස, රි, ග යන ස්වර පමණක් ඇසුරු කිරීම).
- පටු ස්වර ක්ෂේත්‍රයකින් යුක්තය.
- ඒකාකාරී නාද මාලාවකින් යුක්තය.
  (උදාහරණ - දේවතා දුවක්....(පාද හතරම එකම නාදමාලාවක් වීම).
- දීර්ඝ යති සහිතව ඇද පැද ලෙලවා ගායනය කරයි.
- ශුද්ධ සහ කෝමළ දෙයාකාරයෙන්ම නාදමාලා නිර්මාණය වී ඇත.
- අත්වැල් ගායනයකින් යුක්තය.
- සාමූහිකව ගායනය කරයි.
- ඉහළ ශ්‍රැතියකින් ගායනය කරයි .

- නෙළුම් ඕසය, පිරිත් ,හොරණෑ, ගඟුලැලි, කිඳුරු, ආදී විවිධ නාද රූපයන්ට අනුව ගායනය කරයි.

**රිද්මය**

- විලම්බ ලයකින් යුක්තව ගායනය කරයි.
- බොහෝ ගීත මහ තනි තිතට අනුව ගායනය කරයි.
- ගීත ගායනා ආඝාතාත්මක වේ.
- රිද්මය කාර්ය හා බද්ධ වේ.
- ලයාන්විත රිද්මයකින් යුක්තය.

**භාෂාව**

- භාෂාව සරල වේ.
- ආගමික සිතුවිලි, දෙවියන්ගෙන් පිහිට පැතීම ආදී සංකල්පයන් පදමාලාවන්ගෙන් ප්‍රකාශ වේ.
- ගී පදමාලා එළිවැට පිළිබඳව සැලකිලිමත්ව නිර්මාණය වී ඇත.

(ඉහත කරුණු විසිතර කිරීමේ දී අවම වශයෙන් එක් උදාහරණයක් වත් ලියා තිබිය යුතුය).

**(iii) වන්නම්**

- මුසලඩි, ඊරඩි, කුදිරඩි, නෛයඩි, මුසලඩි වශයෙන් ද්‍රවිඩ වචන වන්නම් වලට ඇතුළත් වීම.
- තානම, අඩව්ව, කස්තිරම, ආදී වචන වන්නම් වල භාවිත වීම.
- ඇතැම් වන්නම් වල තනු නිර්මාණයේදී දකුණු ඉන්දියානු ගණිතාලංකාර වැනි සංගීතඥයින්ගේ සහාය ලැබීම.
- ද්‍රවිඩ වර්ණම් යන වචනයෙන් බිඳී වන්නම් යන වචනය නිර්මාණය වීම.
- සරල මෙන්ම සංකීර්ණ නාදමාලාවලින් යුක්ත වන්නම් නිර්මාණය වීම.
  උදාහරණ - සුරපති වන්නම ස සිට උච්ච ස් දක්වා
- සංකීර්ණ තාල රටාවලින් යුක්ත වීම.
  උදාහරණ - මයුරා, මුසලඩි, නෛයඩි

**ප්‍රශස්ති**

- මුද්‍රප්පදය නම් ගායනා අංගය භාවිත වීම.
  උදාහරණ - වරමාතී , ලක්ෂ්මී භුජවාසා
- ගණිතාලංකාර, නාරසිංහ වැනි දකුණු ඉන්දීය සංගීතඥයින්ගේ සහාය ලැබීම.
- සප්තක තුනෙහිම පැතිරී ගිය ස්වර පරාසයකින් යුක්ත වීම
  උදාහරණ - වරමාතී , ලක්ෂ්මී භුජවාසා
- බහු පාද ආකෘතියකින් යුක්ත වීම.
- සංකීර්ණ තාල රටාවලින් යුක්තවීම.
- ද්‍රවිඩ, සංස්කෘත, තෙළිඟු, මලයාලි ආදි වචන භාවිත වීම



අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

**ප්‍රශ්න අංක 05**

**(i)**

- නාඩගම් සංගීතයේ ඇතුළත් තෝඩායම සහ ඉන්නිසය පිළිබඳ අවබෝධය පමණක් පෙන්නුම්කර ඇති විටක 01 ලකුණක් බැගින් ද, එය සුවිශේෂීව පැහැදිලි කර ඇති විටක ලකුණු 02 බැගින්ද, ලබාදීම සිදුවේ. = ල.(2×2) ල. 04 } ල. 06
  උදාහරණ දෙකට ල.(1×2) ල. 02

**(ii)** නාඩගම් සඳහා කර්ණාටක සංගීත ආභාසය නිදසුන් සමග කරුණු හතරක් යටතේ ලිවීමට එක් කරුණකට ලකුණු 01 බැගින් (1×4) ල. 04

**(iii)** නුර්ති ගීතයේ ස්ථායි කොටස ගී පද ප්‍රස්තාර කිරීමට ල. 04
(ආවර්ත හතරක් සඳහා සීමාවීම සුදුසුය).

**(iv)**

- සොකරි සහ කෝළම් රංග ශෛලීන් දෙකෙහි සමානතා හතර ලිවීමට ල. 04 } ල. 06
- සොකරි සහ කෝළම් රංග ශෛලීන් දෙකෙහි අසමානතා දෙකක් ලිවීමට ල.02

**5.** (i) නාඩගම් සංගීතයේ ඇතුළත් තෝඩායම සහ ඉන්නිසය යන අංග උදාහරණ සහිතව විස්තර කරන්න. (ලකුණු 06 යි.)

(ii) නාඩගම් සඳහා ලබා ඇති කර්ණාටක සංගීත ආභාසය පිළිබඳව කරුණු **හතරක්** යටතෙහි නිදර්ශනාත්මක ව පෙන්වා දෙන්න. (ලකුණු 04 යි.)

(iii) නිර්දේශිත නුර්ති ගීතයක් තෝරාගෙන, එම ගීතයේ ස්ථායි කොටස ගී පද ප්‍රස්තාර කර දක්වන්න. (ලකුණු 04 යි.)

(iv) සොකරි සහ කෝළම් රංග ශෛලීන් දෙකෙහි සමානතා **හතරක්** සහ අසමානතා **දෙකක්** ලියා දක්වන්න. (ලකුණු 06 යි.)

**(i)** **<u>තෝඩායම</u>** :-

පොතේ සිංදුව, පූර්ණ විරිදුව ලෙස ද හඳුන්වයි. පොතේ ගුරු විසින් ගයන මෙම කොටස තාලානුරූපී වේ. ප්‍රේක්ෂකයාගෙන් සමාව අයැදීම හා නමස්කාරය සිදුවේ.

උදා :- වෙස්සන්තර නාඩගම - අවිඳු ගණඳුර බිඳ....

බැලසන්ත නාඩගම - ගගන දිය....

**<u>ඉන්නිසය</u>** :-

පොතේ කවිය, පූර්ණ විරිදුව, මූලාරම්භය ලෙස ද ඉන්නිසය සලකයි. අපතාලාත්මකව ගයයි. ඉෂ්ඨ දේවතාරාධනාවකින් යුක්තය.

උදා :- ඉයුජින් - නැණ සයුර....

වෙස්සන්තර - සසර සයුරෙහි....

**(ii)**

- කර්ණාටක රාග ඇසුරින් ඇතැම් නාඩගම් බිහිවීම.
  උදා :- ශංකරා භරනම් , හරිකාම්භෝජ
- උරුට්ටුව නමැති ගීතාංගය භාවිතා වීම
  උදා :- ජොහානා - පන්නා බිඟු පන්නා

- පසන්, චාප්පු, වඩිමුඩි වැනි කර්ණාටක තාල භාවිතය.
- ඉන්නිසය, අගහාරං නමැති කොටස භාවිතා වීම.
  උදා :- ඉන්නිසය - සසර සයුරෙහි.....
- බොහෝ නාඩගම් ගීත තුළ ස්වර පරාසය සංකීර්ණ වීම. (ස්වර සප්තක තුනම භාවිත වීම)
  උදා :- උත්තමවන් ලොව පතලා, ගම්භිර තෙදැති
- දකුණු ඉන්දීය මෘදංගය ඇසුරින් මද්දලය නිර්මාණය වීම.
- දකුණු ඉන්දියානු තෙරුක්කුත්තු විදි නාට්‍ය ආභාසය ලැබීම.

**(iii)** නිර්දේශිත නූර්ති ගීතයක ස්ථායි කොටස ගීත ස්වර ප්‍රස්ථාර කිරීම.

<u>නිර්දේශිත නූර්ති ගීත</u>

- මිහිරි නාද
- මෝක්ෂාචාරි
- සීතා මා සිරියා
- සිරසා පුදාලා
- මා පාද චාරි
- සෝබමාන දේවපුරා
- වාසනා දිනේකි

**(iv)** සොකරි හා කෝලම්

**<u>සමානතා</u>** :-

❖ රංග ශෛලීන් දෙකම දේශීය ගැමි නාටකයන් වීම.
❖ දේශීය ශාන්ති කර්ම ආභාසය ලබා තිබීම.
❖ දේශීය තාල වාද්‍ය භාණ්ඩ භාවිතය.
❖ දේශීය තාල රූප භාවිතය.
❖ ස්ත්‍රී චරිත පිරිමින්ම රඟ දැක්වීම.
❖ රංග ශෛලීන් දෙකම කවි ආකෘතිය මත නිර්මාණය වීම.

**<u>අසමානතා</u>** :-

❖ සොකරි උඩරට ශාන්ති කර්ම තනු රටා ආභාසයෙන් නිර්මාණය වී ඇති අතර කෝලම් පහතරට ශාන්ති කර්ම තනු රටා ඇසුරින් නිර්මාණය වීම.
❖ සොකරි සඳහා කමත භාවිතා වන අතර කෝලම් සඳහා තානායම්පොල භාවිතා වීම.
❖ සොකරි සඳහා උඩරට බෙරය වයන අතර කෝලම් සඳහා පහතරට බෙරය භාවිතා වීම.


අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

## III කොටස

**ප්‍රශ්න අංක 06**

**(i)** එක් විභාගයකට ලකුණු ½ බැගින් විභාග 8 ට ½ × 8 = ල. 04 යි.

(විභාගය තුළ නිවැරදි ස්වර සංකේත යොදා නොමැති නම් එම විභාගයට අදාළ ලකුණු හිමි නොවේ).

**(ii)** තෝරා ගත් මාතෘකා සඳහා එකකට ලකුණු 2 බැගින් මාතෘකා දෙක සඳහා 2 × 2 = ල. 04 යි.

**(iii)** එක් විභාගයකට ලකුණු 1 බැගින් විභාග 8 ට 1 × 8 = ල. 08 යි.

**(iv)** එක් විභාගයකට ලකුණු ½ බැගින් විභාග 8 ට ½ × 8 = ල. 04 යි.

**6.** (i) පහත සඳහන් C minor ස්කේලයට අයත් ස්වර ප්‍රස්තාරය F minor ස්කේලයට අනුව ප්‍රස්තාර කරන්න.

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| පධ | නි | සනි | ධ | ප | - | මග | ම | රි | ග | ප | - |
| ධ | - | පම | ප | ම | ග | ම | ග | රි | ස | - | - |

(ලකුණු 04 යි.)

(ii) පහත සඳහන් මාතෘකා අතුරෙන් **දෙකක්** තෝරාගෙන, කෙටියෙන් විස්තර කරන්න.

- බැලේ
- සොනාටා
- කැන්ටාටා
- සිම්ෆනි

(ලකුණු 04 යි.)

(iii) පහත ගී පද ප්‍රස්තාරයට යොදා ඇති ස්වර සංඝාතවලට (Chords) අනුකූල වන ලෙස පද මාලාවට උචිත තනුවක් නිර්මාණය කර, ගීත ස්වර ප්‍රස්තාර කරන්න.


| C | F | C | G |
|---|---|---|---|
| පෙ ති සැ | ලී S වි සි | රූ ණු කු | සු මි සේ S |

| G | | $G^7$ | C |
|---|---|---|---|
| දි ලෙ ති | අ හ සේ S | කා S ර | කා S වෝ S |

(ලකුණු 08 යි.)

(iv) පහත A **හෝ** B හෝ යන **එක්** කොටසක් සඳහා පමණක් පිළිතුරු සපයන්න.

(A) පහත දැක්වෙන අපරදිග ස්වර ප්‍රස්තාරය පෙරදිග ක්‍රමයට පෙරළා ප්‍රස්තාර කරන්න.



(එක් විභාගයකට ලකුණු ½ බැගින් විභාග 8 කට ලකුණු 04 යි.)

**හෝ**

(B) පහත දැක්වෙන පෙරදිග ස්වර ප්‍රස්තාරය අපරදිග ක්‍රමයට පෙරළා ප්‍රස්තාර කරන්න. පිළිතුරු ලිවීම සඳහා ඔබට සපයා ඇති සංගීතය පිළිබඳ අත් පිටපත (Music Manuscript) යොදා ගත හැක.

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| + | + | ගප | ස | ග | - | -රි | නිස | ධනි | ප | ම | -ග |
| ග | - | රිස | ප | - | සනි | ධනි | පධ | මග | + | රිග | ස |

(එක් විභාගයකට ලකුණු ½ බැගින් විභාග 8 කට ලකුණු 04 යි.)

**(i)** C Minor ස්කේලයට අයත් ස්වර ප්‍රස්තාරය F Minor ස්කේලයට අනුව ප්‍රස්තාරය

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| සරි | ග | මග | රි | ස | - | නිධ | නි | ප | ධ | ස | - |
| රි | - | සනි | ස | නි | ධ | නි | ධ | ප | ම | - | - |

**(ii)**

__බැලේ__

- නිශ්චිත හා විධිමත් ලෙස සැකසූ පාද පියවරයන් සහ අභිනයන් භාවිත කරමින් සංගීතය සඳහා ඉදිරිපත් කරනු ලබන කලාත්මක නර්තනාංගය බැලේ නාට්‍ය වශයෙන් හැඳින්විය හැකිය.
- ශ්‍රී ලංකාවේ දී මුද්‍රා නාට්‍ය වශයෙන් හඳුන්වන අතර එය බැලේ නාට්‍යම නොවේ.
- ක්‍රි.ව. 1300 - 1600 කාලය තුළ ඉතාලියේ දී සම්භාව්‍ය බැලේ නාට්‍ය ජනිතවී ඇත.
- බැලේ නාට්‍යට සුවිශේෂ වූ නර්තන විශේෂය මූලික පාද චලන පහක් මත නිර්මාණය වේ.
- මෙම චලන පාදයේ ඇඟිලි තුඩු මත සිදු කරනු ලබයි.
- සංගීතය මත ඉදිරිපත් කරනු ලබන නර්තනය මෙන්ම, විවිධ දර්ශන හා ඇඳුම් පැළඳුම් ආදිය ද බැලේ නාට්‍යයක වැදගත් වේ.
- බැලේ නාට්‍ය සඳහාම නිර්මාණය කළ හෝ නිර්මාණය වී ඇති සංගීත කෘතියක් නැතහොත් සිම්ෆනියක් මත බැලේ නාට්‍යයක් නිර්මාණය විය හැක.
- රුසියානු ජාතික පීටර් ඉලිච් චයිකොවුස්කි සහ රුසියානු ජාතික ඉගෝර් ස්ටාවින්ස්කි මුල් යුගයේ බැලේ නාට්‍ය සංගීත නාට්‍ය වල සංගීත නිර්මාණකරුවන් ලෙස පිළිගනී.
- බැලේ රංගනය තුළ සංගීතයට සේම වේදිකා අලංකරණය, අංගරචනය, ආලෝක කරණය, ඇඳුම් පැලඳුම් සහ තාක්ෂණික උපක්‍රම වලට ද ප්‍රධාන තැනක් ඇත.
- සිම්ෆනි වලට සමාන විශාල සංගීත භාණ්ඩ ප්‍රමාණයක් භාවිත කරන අතර එම සංගීතාංග තුළ Harmony, Counterpoint, Voice Range වැනි බටහිර ශිල්පාංග භාවිත කරයි.

__සොනාටා__

- චලන (Movements) නොහොත් ප්‍රධාන කොටස් 3 කින් හෝ 4 කින් සමන්විතය.
- පළමු චලනය බොහෝ විට වේගවත් ලයෙන් (Tempo) වයනු ලැබේ.
- දෙවන චලනය අඩු ලයකින් වයනු ලැබේ. එය ගීතවත් විලාසයක් දරයි.
- තෙවන චලනය ප්‍රීතිමත් මෙන්ම ප්‍රාණවත් ස්වභාවයක් උසුලයි. සැම විටම අවසන් වන්නේ සමාප්තිය යනුවෙන් හැඳින්වෙන චලනයෙනි.
- පියානෝව සඳහා රචනා කළ සොනාටා පියානෝ සොනාටා ලෙසද, වයලීනය සඳහා රචනා කළ සොනාටා වයලින් සොනාටා ලෙසද, හඳුන්වයි.
- සංගීත භාණ්ඩ තුනක් සඳහා රචිත සොනාටා (Trio) ත්‍රිත්ව. තුන්කට්ටුව ලෙසින්ද, සංගීත භාණ්ඩ හතරක් සඳහා රචිත සොනාටා Quartet චතුස්තකය ලෙසින්ද හඳුන්වනු ලැබේ.

__කැන්ටාටා__

- කැන්ටාටා යනු මිනිස් කටහඬේ ගැඹුරුම තැන් වලින් බිහි වන සංගීතාංගයකි. සාමාන්‍ය ගායනය ඉක්මවා ගිය ඉතා දියුණු ගායන ක්‍රමයකි.
- කැන්ටාටාව Madrigal යන ගායනා විශේෂයේ හමුවන නාදමාලාවක් ඇසුරින් ගායනය මූලිකව ආරම්භ වී ඇත.
- කැන්ටාටාවේ ඉතිහාසය දෙස අවධානය යොමු කිරීමේ දී එය (17) වන සියවස දක්වා දිව යයි.
- ජර්මනියේ පැවති ගීත ආකෘති නව මාවතකට ගෙන එමින් නවතම ගීත ආකෘතියක් ලෙස කැන්ටාටා බිහි විය.
- මෙය ආගමික ස්වරූපයක් ගන්නා අතර මෙහි දී සමූහ ගායනයන් මෙන්ම තනි තනි හඬවල් සහ යුගල ගායනයන්ද ඉස්මතු වේ.
- කැන්ටාටාවල දී වචනවල අර්ථ පැහැදිලි වීම අනිවාර්ය නොවන අතර හැඟීම් ප්‍රකාශනය තුළින් භක්තිය දැනවීම ප්‍රධාන වේ.
- වාද්‍ය භාණ්ඩවලට වඩා මිනිස් කටහඬට මුල් තැන ලබා දෙමින් ආගමික ස්වරූපයක් ගනු ලබන කැන්ටාටා සඳහා කදිම නිදසුන ලෙස කේමදාසයන්ගේ 'පිරිනිවන් මංගල්‍යය' හඳුන්වා දිය හැකිය.



අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

- එය මෙතෙක් ලොව නිර්මාණය වූ ප්‍රථම බෞද්ධ කැන්ටාටාව වේ.
  මහනුවර යුගයේදී ජනවහර තුළින් භාවිතයට ආ පද්‍යාවලියක් ආශ්‍රයෙන් ජේ . ඊ සේදරමන් විසින් රචිත 'බලියාග විචාරය' කෘතියේ එන බුදුන්වහන්සේගේ පිරිනිවන් පෑම පිළිබඳව රචිත කවි උපයෝගී කර ගනිමින් නිර්මාණය කරන ලද මෙම කැන්ටාටාව (2007) වෙසක් පොහොය නිමිත්තෙන් ඉන්දියාවේ බුද්ධ ගයාවේ ශ්‍රී මහා බෝධීන් වහන්සේ ඉදිරිපිට ගායනා කොට තිබේ.

**සිම්ෆනි**

- සිම්ෆනියක් යනු " වාදක මණ්ඩලයක් සඳහා ලියන ලද සංගීත සංරචනයකි"
- දහඅටවන සියවසේ දී බටහිර වාද්‍ය වෘන්ද මඟින් වැයෙන වැදගත්ම සංගීතාංගය වශයෙන් සැලකෙන නූතන සිම්ෆනිය බිහි විය. එහි නිර්මාතෘවරයා වශයෙන් සැලකෙන්නේ ජර්මන් ජාතික ෆ්‍රාන්ස් ජෝසෆ් හයිඩන් ය. (1732-1809)
- හයිඩන් 'ලන්ඩන් සිම්ෆනි' වැනි සිම්ෆනි කෘති සියයකට වැඩි ගණනක් නිර්මාණය කළේ ය.

**සංධ්වනියක ස්වරූපය හා විශේෂ ලක්ෂණ**

- තේමාවක් තිබීම
- අවස්ථා 03 කින් හෝ 04 කින් යුක්තවීම
  - ( i ) ආරම්භය හා තේමා ප්‍රකාශන අවස්ථාව
  - (ii ) තේමා අර්ථ සියුම් හා ගැඹුරු ලෙස ගීතවත්ව ඉදිරිපත් කිරීම
  - (iii) විවිධ රස මතුකර තේමා ,අර්ථ, තීව්‍ර කෙරෙන අවස්ථාව
  - (iv) තේමාවට අනුගත විවිධ ලයෙන් යුතු, ඒකල, යුගල, ත්‍රිත්ව හා චතුෂ්ක වාදන සංකලන වලින් යුක්ත උච්චතම අවස්ථාව හා නිමාව

- විශේෂ වූ නාද රූපණයක් සංධ්වනිය පුරාම තිබීම
- විවිධ ස්වර පරාසයන්ට අයත් සංගීත භාණ්ඩ රාශියක් භාවිත වීම
- ස්වර සංවාදාත්මක ලක්ෂණය (Harmony) ශ්‍රැති සංවාද (Microtone) සහ ප්‍රති සංවාදන (Counter Point) ලක්ෂණ දක්නට ලැබීම.
- අදහස් ප්‍රකාශනය කිරීම සඳහා සංකේත භාවිතය
- භාවාත්මක හැඟීම් ප්‍රකාශනය විශේෂත්වයෙන් සැලකීම
- මෙහෙයවන්නකු සිටීම (Ochestra Conductor)

**(iii)** ගී පද ප්‍රස්තාරයට යොදා ඇති ස්වර සංගාතවලට (Chords) අනුකූලවන ලෙස පදමාලාවට උචිත තනුවක් යොදා ඇති ප්‍රස්තාරයට ලකුණු පිරිනමන්න. (මෙහිදී තනුවේ නිර්මාණාත්මක බව හා ගලායාමත්, මූලික ශ්‍රැති ස්වරයට අනුකූලවන ලෙස අග මුල සම්බන්ධය පිළිබඳවත් සලකන්න)

**(iv)**

A.

| ස් ප - | -ම ධප මග | ස රි -ස | ධ - මග |

| ම - ගරි | ගම පධ ස්නි | + + රිස් | + රිග් ස් |

B.



**ප්‍රශ්න අංක 07**

i. සරත් දසනායක හෝ ප්‍රේමසිරි කේමදාස විසින් නිර්මාණය කරන ලද

- (නිර්දේශිත) චිත්‍රපට ගීතයක් නම් කිරීමට ලකුණු 01
- තේමාවට ගැලපෙන ලෙස සංගීත සංයෝජනය සිදුකර ඇති ආකාරය විස්තර කිරීමට ලකුණු 02 (දළ පිළිතුරක් ලබා දී ඇති විටෙක ල: 01 කි)
- පද මාලාවට උචිත ලෙස තනු නිර්මාණය සිදුකර ඇති ආකාරය පැහැදිලි කිරීමට ලකුණු 02 (දළ පිළිතුරක් ලබා දී ඇති විටෙක ල: 01 කි)
- නිදර්ශන ගෙනහැර දක්වා තිබීමට ලකුණු 01

ල. 06

(ii)

- කණ්ඩායම් සංගීතයේ දායකත්වය ලැබූ චිත්‍රපට දෙකක් නම් කිරීමට ලකුණු 02
- එම චිත්‍රපට දෙකට අයත් ගීත දෙකක් සඳහන් කිරීමට ලකුණු 02

ල. 04

(iii)

- ස්වතන්ත්‍ර සංගීත නිර්මාණ ඇතුළත් නිර්දේශිත සිංහල චිත්‍රපට තුනක් නම් කිරීමට ලකුණු 03
- එම චිත්‍රපට තුනට අයත් ගීත තුනක් නම් කිරීමට ලකුණු 03

ල. 06

(iv) සරල ගීයක් ප්‍රාසංගිකව ඉදිරිපත් කිරීමේ නව ප්‍රවණතා පිළිබඳව අදහස් දක්වන ලද කරුණු හතරට (එකකට ලකුණු 01 බැගින්) ල. 04

7. (i) සරත් දසනායක සහ ප්‍රේමසිරි කේමදාස යන සංගීතඥයින්ගෙන් එක් සංගීතඥයෙකු විසින් නිර්මාණය කරන ලද නිර්දේශිත චිත්‍රපට ගීතයක් තෝරාගෙන, පහත ශීර්ෂ ඔස්සේ නිදර්ශනාත්මකව ඇගයීමක් කරන්න.
   - තේමාවට ගැළපෙන ලෙස සංගීත සංයෝජනය
   - පද මාලාවට උචිත තනු නිර්මාණය (ලකුණු 06 යි.)

   (ii) දේශීය චිත්‍රපට සංගීතය සඳහා කණ්ඩායම් සංගීතයේ දායකත්වය ලැබූ චිත්‍රපට **දෙකක්** සහ ඊට අදාළ ගීත **දෙකක්** නම් කරන්න. (ලකුණු 04 යි.)

   (iii) ස්වතන්ත්‍ර සංගීත නිර්මාණ ඇතුළත් නිර්දේශිත සිංහල චිත්‍රපට **තුනක** නම් සඳහන් කර එම චිත්‍රපට තුනට අයත් ගීත **තුනක්** වෙන වෙන ම නම් කරන්න. (ලකුණු 06 යි.)

   (iv) සරල ගීතයක් ප්‍රාසාංගිකව ඉදිරිපත් කිරීමේ නව ප්‍රවණතා පිළිබඳ කරුණු **හතරක්** යටතේ අදහස් දක්වන්න. (ලකුණු 04 යි.)

**(i)** <u>සරත් දසනායක</u>

චිත්‍රපටිය - එක්ටැම්ගේ , ගීතය - උන්මාද සිතුවම්

<u>ප්‍රේමසිරි කේමදාස</u>

චිත්‍රපටය - බඹරු ඇවිත් , ගීතය - උදුම්බරා


අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

## තේමාවට ගැලපෙන සංගීත සංයෝජනය

**උන්මාද සිතුවම්........**

- විරහව ශෝකය උද්දීපනය වන පරිදි සංගීත භාණ්ඩ යොදා ගැනීම.(අදාළ සංගීත භාණ්ඩ සඳහන්ව තිබිය හැකිය).
- අතුරු වාදන තුළින් මෙම භාවය මතුකර දක්වා ඇත. ඒ සඳහා අදාළ සංගීත භාණ්ඩ නිසි අයුරින් වාදනය කර ඇති බව.

**උදුම්බරා හිනැහෙනවා......**

- තේමාවෙන් කියවෙන දුක්ඛිතභාවය, විරහව, ශෝකීය බව, තනිකම, සංගීත භාණ්ඩ ඇසුරින් මනාව පිළිබිඹු වීම. (සිතාරය, ගිටාරය, වයලීන් වැනි වාදන කොටස්)
- Counterparts සඳහා චෙලෝ, ඩබල්බේස්, වැනි සංගීත භාණ්ඩ යොදාගැනීම.
- Adlib වාදන කොටස් යොදා තිබීම.
- ගීතයේ සීමාසහිතව සංගීත භාණ්ඩ යොදා ගැනීම තේමාව තව දුරටත් උද්දීපනය වීමට හේතුවේ. (සිතාරය, තබ්ලාව, වයලීනය, ගිටාරය..........)
- ගීතයේ ආරම්භයේ සිට අවසානය තෙක්ම බොහෝ තැන්වල තබ්ලාවත් එකම වාදන කොටසක් වාදනය කිරීම. (හබල් ගැසීමේ රිද්මය)

## පදමාලාවට උචිත තනු නිර්මාණය

**උන්මාද සිතුවම්.....**

- අර්ථය තීව්‍ර කිරීමට ඇතැම් තැන්වල යති ලක්ෂණය යෙදීම. ("තනිවේවි එක්ටැම් ගේ..........." වැනි අවස්ථාවල)
- විෂම ග්‍රහ ලක්ෂණයේ ගීතය ආරම්භ කිරීම.

**උදුම්බරා හිනැහෙනවා.......**

- දුක්බර විරහ රසය තනුව තුළ ජනිත වීම මුහුදේ අවිනිශ්චිත ස්වභාවයට සමාන කොට තනුව නිර්මාණය වී තිබීම.
- සිතුවිලි වල අවිනිශ්චිත බව දැනවීම සඳහා විවිධ තාල රූප භාවිතය. (6/8 ,3/4 වැනි රිද්ම රටා)
- Canaan / Cycling /Over lapping (එක් නාදමාලාවක් නැවත නැවතත් එකිනෙක මත ගොඩනැගෙන අයුරින් යෙදීම) උදාහරණ ලෙස ගීතයේ උදුම්බරා...........කොටස ගැයෙන ආකාරයට අනුව.

> ඉහත ආකාරයේ ආදර්ශ තොරතුරු වලට අදාළ වන ලෙස **ශිෂ්‍ය සාධන මට්ටම අනුව** විවිධාකාරයෙන් ගොනුකර ඇති පිළිතුරු ඇගයීමට ලක් කරන්න.

**(ii)**

- දෙලොවක් අතර - ගයන ගැයුම්
- දුහුලු මලක් - වෙන වයා
- සිහින ලොවක් - ගාලා සුවඳ රස අඳුන්

**(iii)** රේඛාව - ඕළු නෙලුම්, වෙසක් කැකුලු, සුදු සඳ එළියේ

සත් සමුදුර, සිනිඳු සුදු මුතු, පිපුණු කුසුම

හුලවාලි, කුඩා ගමේ

එක්ටැම්ගේ - උන්මාද සිතුවම්

විසිදැල - ගුමු ගුමුව

රන්මුතු දූව - ගලන ගඟකි

බඹරු ඇවිත් - උදුම්බරා

සිතක පිපුණු මල් - කමලාසනි

**(iv)**

- ආවේණික හඬට අමතරව විවිධාකාර නිර්මාණාත්මක හඬින් ගායනය සිදු කිරීම.
- රිද්මයානුකූලව චලන සහිතව ගායන වාදන ඉදිරිපත් කිරීම.
- Audio Track භාවිත කිරීමට පෙළඹීම.
- නව ආරයේ සංගීත සංයෝජනයකින් යුක්තව ගීත ගායනය සිදු කිරීම.
- ඇතැම් අවස්ථාවලදී ශ්‍රාවකයා ද සම්බන්ධ කර ගනිමින් ප්‍රාසංගිකව ඉදිරිපත් කිරීම.
- නවීන Sound System භාවිතයෙන් ඉදිරිපත් කිරීම.
- Video Wall වැනි නවීන තාක්ෂණය භාවිතයෙන් ඉදිරිපත් කිරීම.
- තාක්ෂණය භාවිතයෙන් ආකර්ෂණීය විදුලි ආලෝකධාරා, Smoke Machine , වැනි වේදිකා අලංකරණ ප්‍රයෝග භාවිතය.
- AI සහ Digital තාක්ෂණය භාවිතයෙන් සජීවීව පෙනෙන ලෙස රූප සහ භෞතික වස්තූන් වේදිකාවේ නිර්මාණය කරමින් ඒ හා සමග අවකාශ භාවිතයෙන් රංගන ප්‍රකාශන සහිතව ඉදිරිපත් කිරීම. (Hologram Technology)
- වේදිකාවන්හි සීරු මාරු කළහැකි වේදිකා අංගන කොටස් භාවිතයෙන් අවස්ථානුකූලව ඉදිරිපත් කිරීම.

| |
|---|
| ඉහත ආකාරයේ ආදර්ශ තොරතුරු වලට අදාළ වන ලෙස **ශිෂ්‍ය සාධන මට්ටම** අනුව විවිධාකාරයෙන් ගොනුකර ඇති පිළිතුරු ඇගයීමට ලක් කරන්න. |



අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

**ප්‍රශ්න අංක 08**

එක් කොටසකට ලකුණු පහ (5) බැගින් කොටස් හතරක් සඳහා ලකුණු (5×4) ල. 20 යි.
(ලකුණු පිරිනැමීමේදී පහත කරුණු සැලකිල්ලට ගන්න.)

**(i)**

- අදාළ සංගීතඥයා සිදුකළ සේවාවන්/දායකත්වයන් තුනක් වත් සඳහන් කිරීම — ලකුණු 03
- එම සේවාවන් හෝ දායකත්ව හා සම්බන්ධ කරුණු සඳහා නිදසුන් දෙකක් වත් දැක්වීම. — ලකුණු 02

} ල. 05

**(ii)**

- අදාළ සංගීතඥයා සිදුකළ සේවාවන්/දායකත්වයන් තුනක් වත් සඳහන් කිරීම — ලකුණු 03
- එම සේවාවන් හෝ දායකත්ව හා සම්බන්ධ කරුණු සඳහා නිදසුන් දෙකක් වත් දැක්වීම. — ලකුණු 02

} ල. 05

**(iii)**

- අදාළ සංගීතඥයා සිදුකළ සේවාවන්/දායකත්වයන් තුනක් වත් සඳහන් කිරීම — ලකුණු 03
- එම සේවාවන් හෝ දායකත්ව හා සම්බන්ධ කරුණු සඳහා නිදසුන් දෙකක් වත් දැක්වීම. — ලකුණු 02

} ල. 05

**(iv)**

- අපරදිග සංගීත භාණ්ඩ වර්ගීකරණය පිළිබඳව කෙටියෙන් හැඳින්වීම සඳහා — ලකුණු 01
- Wind Instrument කොටස් පිළිබඳ විස්තර කිරීමට — ලකුණු 02
- නිදසුන් (දෙකකට සීමාවී) ගෙනහැර දැක්වීමට — ලකුණු 02

} ල. 05

(අපරදිග සංගීත භාණ්ඩ වර්ගීකරණයට අදාළව ගැලීම් සටහන පමණක් දක්වා ඇති විටෙක ලකුණු 02 ක් පමණක් ලබා දිය යුතුය.)

**(v)**

- කායදා යන්න පිළිබඳ විස්තර කිරීමට — ලකුණු 01
- පල්ටා යන්න පිළිබඳ විස්තර කිරීමට — ලකුණු 01
- කායදාව ප්‍රස්තාර කිරීමට — ලකුණු 01
- පල්ටාව ප්‍රස්තාර කිරීමට — ලකුණු 01
- සමස්ත ප්‍රස්තාරකරණ කුසලතා සඳහා — ලකුණු 01

} ල. 05

**8.** පහත සඳහන් කොටස් අතුරෙන් **හතරක්** තෝරාගෙන පිළිතුරු සපයන්න.

(i) උතුරු ඉන්දීය සංගීතයේ දියුණුව සඳහා පහත එක් සංගීතඥයකුගෙන් සිදු වූ සේවය නිදසුන් සහිතව කෙටියෙන් පැහැදිලි කරන්න.

(a) අමීර්ඛුස්රු

(b) භාත්කණ්ඩේ

(ii) ලයනල් එදිරිසිංහ සූරීන්ගෙන් සංගීත අධ්‍යාපනයට සිදු වූ සේවාව කෙටියෙන් විස්තර කරන්න.

(iii) ඩබ්ලිව්. බී. මකුලොලුව සූරීන් විසින් රචිත 'හෙළ ගී මග' ග්‍රන්ථය පාසල් සංගීත අධ්‍යාපනයට දායක වී ඇති ආකාරය කෙටියෙන් විස්තර කරන්න.

(iv) අපරදිග සංගීත භාණ්ඩ වර්ගීකරණය හඳුන්වා, එහි Wind Instruments කොටස පිළිබඳ නිදසුන් සහිතව විස්තර කරන්න.

(v) තබ්ලා වාදනයක ඇතුළත් කායදා සහ පල්ටා යන අංග දෙක විස්තර කර, ත්‍රිතාලයට අදාළ වන සේ කායදාවක් සහ පල්ටාවක් තාලානුකූලව ලියා දක්වන්න.

(ලකුණු 05 × 4 = ලකුණු 20 යි.)

(i)

**(a) - හස්රත් අමීර් කුෂ්රු**

- සුල්තාන් අලව්දීන් බිල්ජි රජුගේ රාජ සභාවේ ප්‍රධාන සංගීතඥයා ලෙස කටයුතු කර ඇත.
- සාහිත්‍යය, කාව්‍යය, නාට්‍ය සංගීතය පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරමින් භාරතීය සංගීතයට විශාල සේවයක් ඉටු කර තිබීම.
- ඛ්‍යාල්, තරාණා, කව්වාලී සහ ගසල් වැනි ගායන ශෛලීන් නිර්මාණය සහ පෝෂණය කිරීම.
- පර්සියානු සංගීතය සමග උත්තර භාරතීය රාගධාරී සංගීතය මිශ්‍ර කර ගනිමින් නව රාග බිහිකිරීම.
- නිර්මාණය කරන ලදැයි සඳහන් වන රාග
  යමන්, තෝඩි, සහානා, සර්පර්දා,
- නිර්මාණය කරන ලදැයි සඳහන් වන සංගීත භාණ්ඩ
  සිතාරය (වීණාව අනුසාරයෙන්), තබ්ලාව (පඛ්වාජය අනුසාරයෙන්)
- නිර්මාණය කරන ලදැයි සඳහන් වන තාල
  ත්‍රිතාල්, චෞතාල් , දාදරා, සවාරි, ආඩචෞතාල්
  (පිළිතුරු ලෙස සපයා ඇති වෙනත් නිවැරදි තොරතුරු ද අදාල කරගන්න.)

**(b) - විෂ්ණු නාරායන් භාත්කණ්ඩේ**

**ඔහු විසින් රචනා කරන ලද ග්‍රන්ථ :-**

කාණ්ඩ 6 කින් යුත් ක්‍රමික් පුස්තක් මාලිකා, ස්වර මාලිකා සංග්‍රහ,ලක්ෂණ ගීත් සංග්‍රහ, අභිනව රාග මංජරී, ශ්‍රීමත් ලක්ෂ්‍ය සංගීත්, සංගීත් පරිජාත් ප්‍රවේශිකා, රාග විබෝධ ප්‍රවේශිකා.

**සංගීතයට කළ සේවය**

- උත්තර භාරතීය සංගීතයේ න්‍යායාත්මක තොරතුරු ඉදිරිපත් කිරීම.
- භාරතීය විවිධ සංගීතඥයින් හමුවී ඔවුන් සතු දැනුම හා උරුමයන් එක් රැස් කරමින් සංගීත පර්යේෂණ කාර්යයේ නියැලීම.
- මේල 72 පිළිබඳ අධ්‍යයනය කර උත්තර භාරතීය ථාට පද්ධතිය නිර්මාණය කිරීම. (දශථාට)
- හින්දුස්ථානි සංගීතයට ස්වර ප්‍රස්ථාර ලේඛන ක්‍රමයක් හඳුන්වා දීම.
- සංගීත ආයතන ගොඩනැගීම.
- සංගීත ආයතනික අධ්‍යාපන හා ඇගයීම් ක්‍රම හඳුන්වා දීම.
- සංගීත අධ්‍යාපනයට අදාළව ශාස්ත්‍රීය සහ ප්‍රායෝගික විෂය කරුණු ඉදිරිපත් කිරීම.
  (පිළිතුරු ලෙස සපයා ඇති වෙනත් නිවැරදි තොරතුරු ද අදාල කරගන්න.)

**(ii)** ලයනල් එදිරිසිංහ

- ලංකා ගාන්ධර්ව සභාව තුළින් සංගීත අධ්‍යාපනයට මෙහෙවරක් ඉටු කිරීම.
- එම සභාව මගින් පවත්වන ලද සංගීත විභාග ප්‍රවර්ධනයට කටයුතු කිරීම.
- පාසල් සංගීත ප්‍රධාන පරීක්ෂකවරයා ලෙස දිවයිනේ සංගීත අධ්‍යාපනයට කළ මෙහෙය.
- සංගීත අධ්‍යාපනයට අදාළ විවිධ විෂය නිර්දේශ සකස් කිරීමට පෙරමුණ ගැනීම.
- රජයේ සංගීත විද්‍යාලය ආරම්භ කිරීමේලා පෙරමුණ ගෙන කටයුතු කිරීම.
  (පිළිතුරු ලෙස සපයා ඇති වෙනත් නිවැරදි තොරතුරු ද අදාල කරගන්න.)

**(iii)** ඩබ්ලිව්. බී.මකුලොලුව (හෙළ ගී මග)

- සංගීත අධ්‍යාපනය ලබන සිසුන් සඳහා ජන ගී ඉතා පැහැදිලි ව ප්‍රස්තාර කොට තිබීම.
- ජන ගී සිද්ධාන්ත හා ප්‍රායෝගික කොටස් අධ්‍යයනයට ප්‍රයෝජනවත් වීම.
- ජනගී වර්ගීකරණ ආකෘතියට අනුව ගීත එක්රැස්කර තිබීම.
- පස්මත් විරිතේ සිට සතිස්මත් විරිත දක්වා විවිධ ජනගී ගීතස්වර ප්‍රස්තාර කර තිබීම.
- ලඝු, ගුරු, විරිත්, යති ආදී සිද්ධාන්තමය කරුණු රැසක් ඇතුළත් කර තිබීම.




අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

Past Papers Wiki



- දේශීය තිත් විධිමත්ව ප්‍රස්තාර කර තිබීම.
- පාසල් සංගීත විෂය මාලාව ගොඩනැගීමේ දී මෙම කෘතිය ආධාර කරගෙන තිබීම.
(පිළිතුරු ලෙස සපයා ඇති වෙනත් නිවැරදි තොරතුරු ද අදාල කරගන්න.)

**(iv)**




**(v)**

**කායදා :-**

කායදා යනු තබ්ලා පුහුණු වන ආධුනිකයෙකුට තම අතෙහි ඇඟිලි හුරුකර ගැනීමට මූලික පුහුණුවීමට අවශ්‍ය අභ්‍යාස වේ.

**පල්ටා :-**

පාල්ටා යනු කායදාවේම දීර්ඝ විස්තරයකි. මෙය නිර්මාණය වන්නේ කායදාව නිර්මාණය කර ඇති පද සහ ආකෘතියට අනුවය. කායදාව ගුණකර ලබාගන්නා ලයෙන් පල්ටා වාදනය සිදුවේ.

| | x | | | | 2 | | | | 0 | | | | 3 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ධා | ධිං | ධිං | ධා | ධා | ධිං | ධිං | ධා | ධා | තිං | තිං | තා | තා | ධිං | ධිං | ධා |
| කායදා | ධා | ධා | ති | ට | ධා | ධා | තු | නා | තා | තා | ති | ට | ධා | ධා | තු | නා |

පල්ටා |ධාධා තිට ධාධා තිට |ධාධා තිට ධාධා තූනා |තාතා තිට තාතා තිට |ධාධා තිට ධාධා තූනා |

***

ORDER A/L
TERM TEST PAPERS,
SHORT NOTES,
WORKBOOKS & REVISION
BOOKS

SINHALA, ENGLISH & TAMIL MEDIUM



LOL BOOK STORE

CASH ON DELIVERY AND KOKO PAYMENT AVAILABLE

0717774440 (WHATSAPP)

WWW.LOL.LK